
# චින්තන දෙකක් යහ පාලනයකකට කරුණු සියයක්




ධර්ම කීර්ති ශ්‍රී දේශමාන්‍ය

ආචාර්ය ධම්මික පියතිස්ස බිබිලේ

ජනාධිපති ලේකම් කාර්යාලය
03 NOV 2015
පුස්තකාලය

SATEP
සත්‍යා

**සත්‍යාර්ථ සාම ප්‍රවර්ධන සමාජය**
**128/B දෙවන පටුමග, මොරගහලන්ද මාවත, ඇරැව්වල**
**පාර, මොරකැටිය පන්නිපිටිය**
**Mobile 0718387090 Email dbiobile@gmail.com**

ගරු අගමැති තුමා මගින් ගරු ජනාධිපති තුමා වෙත

නවෝදයට නව මගක් කෘතියේ පිටපතක් මේ සමග ඇත

මෙම ලියවිල්ල කියවා බලන්න යථාර්ථය තේරුම් ගන්න

විස්තර පසුවට ද එවමි

ධර්ම කීර්ති ශ්‍රී දේශමාන්‍ය
ආචාර්ය ධම්මික පියතිස්ස බිබිලේ
නිර්මාතෘ
සත්‍යාර්ථ සාම ප්‍රවර්ධන සමාජය 2015-02 - 27



ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

| | |
|---|---|
| පරි. අංක | 6363 |
| වර්ග අංකය | 320 |
| දිනය | 2015.11.03 |

128/ බී.දෙවන පටුමග,
මොරගහලන්ද මාවත,
ඇරැව්වල පාර,
මොරකැටිය,
පන්නිපිටිය.
2014- 12 -18

**අතිගරු ජනාධිපති ධූරන්දර**
**මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා**
**වෙත ඉමහත් ගෞරවයෙනි.**

මේ සමග ඔබතුමා වෙත මෙම ලියවිල්ල එවන්නේ
මෙම අවස්ථාවේ දී එය බෙහෙවින් ඔබ තුමාට
වැඩදායක වේ හැයි සිතු හෙයිනි.

**කොතරම් අවිවේකී වුවත් සුළු වේලාවක් මිඩංගුකර මෙය කියවා ගන්න.**

වැඩදායක වේවි.

සුළුවෙන් වුවත් රට වෙනුවෙන් කළහැකි දේ  කළ යුතු දේ
ශක්ති පමණින් කරමින් සිටින්නෙමි.
අත දෙන්නට බොහෝ අය දක්වන්නේ මැළි බවකි.
මෙවැන්නක් කීවාට අහිතක් නොසිතන්න.
අදහස් යා යෝජනා අපමණ තිබේ.
අසන්නට කිසිවකු නැත .
මෙම ලියවිල්ල දීර්ඝ වැඩි වුවත් කියවා බලන්න.

සුදුසු යැයි සිතන්නේ නම් ප්‍රයෝජනයට ගන්නැයි අයදිමි.
සියලු කටයුතු සර්වප්‍රකාරයෙන් ම සාර්ථක වේවා!
දීර්ඝායු වේවා!
චිර ජීවනය ලැබේවා!

හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
ප්‍රධාන උපදේශක හා නිර්මාතෘ ළමා නිකේතනය
නිර්මාතෘ හා කැඳවූ මිකරු සත්‍යාර්ථ සාම ප්‍රවර්ධන සමාජය.

ජනාධිපති ධූරන්දර මෛත්‍රීපාල සිරිසේන මැතිතුමනි

ගෞරවයෙනි
පළමු ව ඔබතුමාට සුබ පතමි
දෙවනුව මගක් කියන්නෙමි
ඒ අනුව සිතා බලන්න .
මට සිතෙන පිළිවෙළ මම කියන්නෙමි

මම ඔබ තුමා ව මුණ ගැසුනේ සෞඛ්‍ය අමාත්‍යාංශයේදී ය
ඒදින රෝග සුවයට චිත්ත බලය නමැති පොත් පිංච ප්‍රධානය කළ අවස්ථාව මතක ඇතායි සිතමි.
මෙහි ඇතුළත් වන්නේ .මාගේ චින්තනය තුළින් එළිදක්වා සත්‍යාර්ථ සාම ප්‍රවර්ධන සමාජය තුළින් ක්‍රියාත්මක කරන්නට යෝජිත පිළිවෙළකි.

**සංවර්ධනයට නව මාවතක්**

**මන්ත්‍රීවරුනට මැති ඇමතිවරුනට මෙම කවි කියා දෙන්න**

කවුරුත් හිතන්න රට දැය රකින්න
කවුරුත් හිතන්න නොබෙදී සිටින්න
කවුරුත් හිතන්න හොඳ හිත රකින්න
වාද භේද හැම අමතක කරන්න

අනාගතය දරුවන්ගේ අමතක කර ඉන්න එපා
දරුවන්ගේ වගකීමෙන් නිදහස් වී යන්න එපා
දූ දරුවන් ඉන්න තැනදී වාද භේද කිසිත් එපා
සමගියෙ සිත පෑරෙන ලෙස කුරිරු වදන් දොඩනු එපා

මහජන මුදල් ද පොදු දේපළ නම් කිසිවිට හොරකම් කරනු එපා
විපාක දෙනවා කල් යන්නට පෙර කිසිම මැරකමක් කරනු එපා
වංචා කරන්න මිනිසුන් පෙළන්න කිසිවිටකදී වැඩ කරනු එපා
පල දෙනවාමයි කල් යන්නට පෙර අන්සතු දේ නම් ගන්න එපා

මේ කවි පැදි සිහිකර ගෙන දේශපාලන ක්ෂේත්‍රයේ නියැලුණු සියලු දෙනාට මෙම කරුණු කියන්න

පහත සඳහන් කරුණු රටට කියන්නේ නම් ඉතා හොඳයි
මේ දේ ක්‍රියාත්මක කරන්නට උත්සාහ කරන්න.

1) දේශපාලනඥයන් පරිපාලකයන් ඇතුලු සියලු දෙනාට මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා ඉක්මන් පුහුණුවක් ලබා දීමට ප්‍රමුඛත්වය දෙන්න.

2) පූජ්‍ය පූජක පක්ෂය හා ගුරුවරුනට ද සියලු ම ආරක්ෂක අංශ වෙත ද මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා විශේෂ පුහුණුවක් ද ලබා දෙන්න.

3) ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ද පොලිස් සේවයේ කාන්තා කාර්යාංශයේ ද සියලු ම තරාතිරම්වලට අයත් නිලධාරීනට ද ගුරුවරුනට ද මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය පිළිබඳ ව පුහුණුවක් ලබා දෙන්නට ඉක්මන් පියවර ගන්නා ලෙස ද ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමි.

★ එසේ නොවුවහොත්

**අසීම තණ්හාව,ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය ද්වේශය, උද්දච්ඡ බව, අන්‍යයන් නොතකා හැරීම, යනාදි අසීම වූ දුර්ගුණ නිසා පංචවිධ දුශ්චරිතයට පෙළඹි සමහර දේශපාලනඥයන් ඇතලු විවිධ පුද්ගලයින් නොමග ගොස් නැවත ශ්‍රී ලංකාව ආගාධයකට ඇද දමන්නට ඉඩ ඇත.**

ඔබතුමාගේ මෛත්‍රී ශක්තිය හා බලය ද

සෙනෙහෙබර ආධ්‍යාත්මය ද සමග

විශ්ව ශක්තිය ද ආකර්ශනය කරගෙන

අපගේ දහම් දිවයිනේ සිසිලස

සකල ලෝකයාට ම ලබා දෙමින්

ලෝක දේශපාලන ක්ෂේත්‍රයේ ප්‍රථම හා

ප්‍රමුඛ ආදර්ශවත් රාජ්‍ය කරන්නට

ඔබතුමාට භාග්‍ය ඇත.

[redacted]

එම භාග්‍ය උදාකර ගන්න.

සත්‍යාර්ථ සාම ප්‍රවර්ධන සමාජය සතු

පුංචි නව දැක්ම ද

ඔබ තුමා ලබා ගන්න.

එම දැක්ම අනුව ඉදිරියට යන්නට

ඔබතුමා වෙත කරන

සුභද ආරාධනය

සටහන් කර ඉදිරිපත් කරන

මෙම සන්දේශය

ඔබ තුමාගේ චින්තනය හා

අනාගත සැලසුම්

විධිවත්කර ගැනීම සඳහා

නිහතමානී ව ඉදිරිපත් කරමි.

නැතහොත් ඔබ තුමා සමීපයෙහි ම සිටින්නවුන්

ඔබ තුමාට චින කරන්නට

වැරදි තොරතුරු දෙන්නට

ඔබ තුමාට වැඩදායක අයට

ඔබතුමාට සමීප වන්නට ඉඩ

නොදෙන්නට පිළිවන

නැතිනම් අනපේක්ෂිත ලෙස

ඔබ තුමාට එරෙහිවන්නට ඉඩ ඇත

එසේවීම රටට අහිතකර ය

එමෙන් ම ඔබ තුමන්ට වරදින තෙක්

බලා සිටින පිරිසක් ඇති බව අමතක

නොකරන්න.

එම නිසා කල්පනාකාරී වන්න

සත්‍ය මත පිහිටා කටයුතු කරන්න !

SATEP

සත්‍යා

සත්‍යාර්ථ සාම ප්‍රවර්ධන සමාජය

නව ලෝකයක් ගොඩ නැගීම සඳහා

සත්‍ය, අර්ථ, සාම,

යන සංකල්ප තුන

පදනම් කරගෙන

අධිෂ්ඨාන පූර්වක ව

ශ්‍රී ලංකාව නව මාවතකට යොමු කරන්නට

පෙරමුණ ගන්නා සමාජයකි

වර්තමාන ජනාධිපති තුමා ඇතුලු

සියලූ දේශානුරාගී,

දේශ මාමක, ජාති මාමක,

මානව හිතවාදී පාර්ශ්වයන් සමග

එකමුතු ව

මානව වර්ගයා වෙනුවෙන්

මෙහෙවරක යෙදෙන්නට

සත්‍යාර්ථ සාම ප්‍රවර්ධන සමාජය

ප්‍රතිඥා දී ඇත.

ඔබ තුමා ජනාධිපති තනතුර

බාරගත් දිනයේ දී

මෙම ප්‍රතිඥාව

ඔබතුමාගේ ද ප්‍රතිඥාව කරගෙන

දේශයේ හා ජාතියේ පීවයට

දැහැමින් පණ පොවන්නට

ඔබ තුමාට

ශක්තිය ධෛර්යය ලැබේවා!

(පහත සඳහන් අපගේ පරම අධිෂ්ඨානය

ඔබතුමාගේ ද

පරම අධිෂ්ඨානය වේවා

අධිෂ්ඨානය



ශ්‍රී ලංකා මෑණියගේ දරුවකු ලෙස ඉපදී
සෙනෙහසේ පහස භුක්ති විඳින සියලු
දේශමාමකයිනි,
ලක් දෙරණ අප සැමගේ ය.
කොතරම් බාධා හිරිහැර දුක් කම්කටොළු පැමිණිය ද
අපට ජීවය දෙන මාතෘභූමිය දිවි හිමියෙන් සුරැකීම හා
පෝෂණය කිරීම සඳහා ධාන්‍යාගාරයක් ධාන්‍යභූමියක්
අපගේ මිහිතලයෙන් බිහිවන තෙක්
අප්‍රතිහත ධෛර්යයකින් යුක්ත ව
එකාවන් ව වැඩ කරමු.
මිනිස් දහමත් සාමයත් ඇත්තේ
මනුෂ්‍ය ආධ්‍යාත්මය තුළ බව
අපගේ රුධිරයට කාවැදෙන තෙක්
අපගේ දේශය නැවත ගොඩ නැංවීම සඳහා
මිනිස් ගුණධර්මවලින් අපගේ ආධ්‍යාත්මය
පෝෂණය කරගනිමු.
නිසරු ආකල්පවලින් පණ පෙවී
ජීවිත අපේක්ෂා භංග කරන බලවේග
ශ්‍රී ලංකා වාසීන්ට එරෙහි ව නැගී සිටිය ද
යුද්ධය හා මරණය සඳහා අමෝරා ගන්නා
සතුරු අවි ආයුධ පසෙක දමන්නට සලස්වා
නිසරු බිම් සරු කරමු .
මිහිතලය පුරා සුවහසක් මෙත්ගුණ මුකුලිත කරන
දහම් සිසිලසින් සැනසෙමින්
සොබාදම් දිනිතිය විසින් ජීවය දෙන
ජල දහරාවන්ගේ තෙතමනයෙන්

සුන්දර දෙරණ අස්වද්දමින්
සරු බීජ මහ පොළොවේ වපුරමු.
දෑතේ සවිය යොදා
කෙත්වත්වල වැඩ කරමින් අපගේ
ස්වර්ණ භූමිය පෝෂණය කරමින්
ජාති වාත්සල්‍යයේ ජවය ලක් දෙරණට මුසු කරමු.
අස්වනු නෙලා කාසි පනම්වලින් අතමිට සරු කරගෙන
සකල ලෝක සත්ත්වයාට ම යහපත කරන්නට
විශ්ව ශක්තිය සමග මුසුවී
හෘද සාක්ෂියට එකඟ ව අභීත ව
හෙළ දෙරණ මත එක්සත් ව එක්සිත් ව කටයුතු කරමු.
දුර්මත කැටිකොටගත් මෝහාන්දකාරය
විනිවිදගෙන යන්නට
මිනිස් දහමේ ස්වර්ණාලෝකයෙන්
ප්‍රඥාවේ ප්‍රදීපය දල්වමු.
දිවි හිමියෙන් අප සුරකින, අප සමග සදාතනික ව
දිවි ගෙවන්නට දිරි දෙන
ශ්‍රී ලංකා මෑණියනි ඔබ සදා සැරදේ

## සෞභාග්‍යවත් දේශයකට මග
## කරුණු සියයක්

සාමය සිහසුන් ගත කළ සෞභාග්‍යවත් දේශයක් ගොඩ නගා ගන්නටත් ආසියාවේ සෞභාග්‍යවත් දේශය බවට ශ්‍රී ලංකාව පත්, කරන්නටත් සුබ අනාගතයක්
ශ්‍රී ලංකාවට උදාකර දෙන්නටත් අතිගරු ජනාධිපතිතුමා ඇතිකරගෙන පවත්නා අදහස අතිශය වැදගත් ය.
කාලෝචිතය.
එවැනි ඉලක්කයක් තබා ගැනීම ගැන දොස් පැවරිය නොහැකි ය.
එහෙත් සියලු ම දේශපාලන පක්ෂ ද
ගරුතර මහා සංඝරත්නය ද
අවශේෂ ආගම්වල පූජ්‍ය පක්ෂය ඇතුලු සියලු ම විද්වත් පාර්ශ්වයන් එකමුතු ව දේශපාලනඥයන්ගේ න්‍යාය පත්‍ර දේශ හිතෛෂී මානව හිතවාදි තත්ත්වයකින් සකස්කර දීමට උදව් විය යුතු අවස්ථාවකට දැන් අප පිවිස ඇත.එම නිසා අප තරයේ සිතට ගතයුතු කරුණු සමූහයක් පහතින් පෙළගස්වමි.

එසේ නොමැති වුවහොත් නැවතත් සාමය කඩවන, දූෂණය හා අසාධාරණයට මං සලසන අවස්ථා ඇතිවිය හැකි ය.

අතිගරු ජනාධිපති තුමනි ඔබතුමාගේ අවධානය මෙම කරුණු කෙරෙහි යොමුකර මෙත් සිතක් ඇතිකර ගෙන ජව සම්පන්න ව ඉදිරියට යන්නටත් මැති ඇමතිවරුන් හා නිලධාරීන් පෙළගස්වන්නටත් කාරුණික වන්න.

1) ගරුතර සංඝරත්නය ඇතුලු පූජ්‍ය පක්ෂය මහජනතාව විසින් හඳුනාගෙන සිටින්නේ සාමය සෞභාග්‍ය ය ලබා දෙන්නටත් මහජනතාවට හා දේශපාලනඥයනට නිවැරදි මගපෙන්වීමක් කරන්නටත් කැපවී සිටින ගෞරවනීය නියාමකයන් වශයෙන් බව අමතක නොකළ යුතු ව ඇත.

2) ගරුතර සංඝරත්නය ඇතුලු පූජ්‍ය පක්ෂය මෙම විශ්වාසය ඉහළ තලයකට ගෙන එන්නට හැකි පරිදි කටයුතු කිරීම අත්‍යාවශ්‍ය ය.

3) අප ගතකරමින් සිටින මෙම කාලවකවානුව ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලිය සම්බන්ධයෙන් බෙහෙවින් තීරණාත්මකවන හෙයින් සියලු ම පූජ්‍ය පූජක පක්ෂයන්ගේ ම අවදි බව රට ගමන් කරවන දිසාව ගැන නිරතුරු ව විමසුම් සහගත වන්නට මග පෙන්වීම, අත්‍යාවශ්‍ය වේ.

4) විශේෂයෙන් ම දේශපාලන පක්ෂපාතිත්වයෙන් තොර ව සියලු ම දේශපාලන පක්ෂවලට සත්‍යවාදී ව කටයුතු කරන්නට මගපෙන්වී ම බෙහෙවින් වැදගත් වේ.

5) ශ්‍රී ලංකාවේ ගමන් මග, මෙතැන් පටන් වඩාත් නිවැරදි කරගන්නට අතිගරු ජනාධිපති තුමාගේ මහින්ද චින්තනය වැඩි දුරටත් පෝෂණය කර දෙමින් සියලු ම පටු අදහස් ඉවතලා ජාති භේද, ආගම් භේද පක්ෂ භේද නොතකා රට ගැන කැක්කුමක් ඇති සියලු පාර්ශ්වයන් සමග එක්සත් ව එක්සිත් ව කටයුතු කරන්නට දේශපාලනඥයින් උනන්දු කළ යුතුව ඇත.

6) පොදු මහජනතාවගේ ගැටළු ප්‍රශ්නවලට සාවධාන ව සවන් දෙමින් ඒවාට විසඳුම් ලබා දෙන්නට සුවිශේෂ වැඩ පිළිවෙළක් දේශපාලනඥයින් විසින් සකස් කරගත යුතුව ඇත.

7) එය තිරසාර දිගු කාලීන වැඩ පිළිවෙළක් විය යුතු ව තිබේ. එමෙන් ම සාමය සිහසුන් ගත කිරීම සඳහා මෙතෙක් ආ ගමන් මග වැඩි දුරටත් එළිපෙහෙළි කරන්නටත් තැරසාර කරන්නටත් සියලු ම තරාතිරම්වලට අයත් නිලධාරීන් ද සියලු ම පූජ්‍ය පූජකයන් වහන්සේලා ද දේශපාලනඥයින් ද කළයුතු ප්‍රධාන කාර්යයන් තිබේ.

8) පළමු ව තමන්ගේ මනස ප්‍රධාන කරගෙන තම තමන්ගේ පෞරුෂ හා නායකත්ව භූමිකා මානව ගුණධර්මවලින් පෝෂණය කරගැනීම අත්‍යාවශ්‍ය ය.

9) මේ සඳහා සියලු ම දේශපාලන පක්ෂවලට අයත් දේශපාලනඥයින් ද නිලධාරීන් ද
ප්‍රජා නායකයින් ද

- ★ ඊර්ෂියාව, තරහ ව, ක්‍රෝධය, කෝපය,
- ★ වෛරය, ද්වේශය, උද්දච්ච බව, ආත්මාර්ථකාමී බව,
- ★ අන්‍යයන් කිසිවක් නොදන්නා වැඩකට නැති අය බව සැලකීම,
- ★ අන්‍යයන්ගේ අදහස්වලට නිසි ලෙස සවන් නොදීම,අවිවේකි බව,
- ★ තම තමන්ගේ පෞද්ගලික න්‍යාය පත්‍ර අනුව කටයුතු කිරීම

★ **තමන්ගේ පෞද්ගලික අභිමතයට මුල්තැන දීම,**

★ **සියලු දේ දන්නා එක ම පුද්ගලයා තමා යැයි සිතමින් ස්ව මතයෙහි එල්බගෙන සිටීම,**

යන දුර්ගුණවලින් අත්මිදීම අත්‍යාවශ්‍ය ව ඇත.

10) මුදල් තණ්හාව දේපළ තණ්හාව අත්හරින්නට හැකිනම් රටට ම සෞභාග්‍ය උදා කිරීමටත් මහජන විශ්වාසය තහවුරුකර ගන්නටත් ප්‍රබල රැකුලකි.
තමන්ටත් පහසුවකි.

11) රටවැසියා පංචවිධ දුෂ්චරිතයෙන් අත්මුදවා ගැනීම සඳහා ඇබ්බැහි ව සිටින යම් දුශ්චරිතයක් වේ නම් එයින් ඉවත්වන්නට උත්සාහ ගැනීම සැබෑ ලෙන්ගතු බවක් මහජනතාවට තිබෙන දේශපාලනඥයන්ගේ යුතුකමකි.

12) දේශපාලනඥයිනි ඔබ රටේ වැඩිහිටියකු ද වැඩිහිටියන්ගේ වැඩිහිටියකු ද වන බව අමතක නොකරන්න.

13) මහජන දුක හොඳින් අවබොධකර ගන්නටත්, මහජන දුක ඉවෙන් හඳුනා ගන්නට තරම් සංවේදී පුද්ගලයකුවීමත් අත්‍යාවශ්‍ය බව සලකන්න.

14) මේ සඳහා මානව ගුණධර්ම සංවර්ධනයකර ගැනීමත් ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා කටයුතු කිරීමත් ඒ සඳහා පුහුණුවක් ලැබීමත් අත්‍යාවශ්‍ය ය.

15) විශේෂයෙන් ම නවක දේශපාලනඥයින් මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලබා ගන්නා ප්‍රවීනතාව ඔවුන්ගේ දේශපාලන අනාගතය සම්බන්ධයෙන් අතිශයින් වැදගත් ය.

16) මේ සඳහා නොදන්නා දේ දැනගන්නටත් දන්නා දේ නැවත සිහිපත්කර ගන්නට හා ක්‍රියාවට නංවන්නට ලබා ගන්නා හුරුකම් ඉතා වැදගත් ය.

17) ශ්‍රී ලංකාව සෞභාග්‍යවත් දේශයක් බවට පත්කර ගැනීම සඳහා

- ★ එකමුතු ව කැපවී කටයුතු කරන්නටත්
- ★ සාමකාමී සමාජයක් හා දේශයක් ගොඩනගා ගන්නටත්
- ★ දිරි දෙන නව චින්තනයක් හා සැළසුම් සහගත නව වැඩ පිළිවෙළක් සකස් කරගෙන
- ★ ශ්‍රී ලංකාවේ ගෞරවය ආරක්ෂාවන පරිදි කටයුතු කිරීමේ වගකීම ද සියලු ම දේශපාලනඥයිනට පැවරී ඇති බව දේශපාලනඥයින් විසින් කිසිසේත් අමතක නොකළ යුතු ව ඇත.
- ★ විශේෂයෙන් ම ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරු තම නායකයාගේ ගෞරවය ආරක්ෂාවන පරිදි කටයුතු කරන්නට වගබලාගත යුතු ව තිබේ.
- ★ නිරතුරු ව රටේ තත්ත්වය මහජන අවශ්‍යතා යනාදිය පිළිබඳ ව නායකත්වය දැනුවත් කිරීමත්
- ★ නායකත්වයට පහසුව ඇතිකර දෙන පරිදි තම යුතුකම් හා වගකීම් ඉටුකර දීමත්

★ ප්‍රමාද දෝෂ වළක්වා ගැනීම සඳහා නායකත්වයට ශක්තිය ලබාදීමත් කළ යුතුව තිබේ.

18) පූජ්‍ය පූජක පක්ෂයේ අවවාද අනුශාසනාවලට සවන් දෙන දේශපාලඥයින් රටට
අවශ්‍ය ය.

19) අමනාපකම් ගොඩනගා ගෙන වෛරය ද්වේශය පළිගැනීම පෙරටු කරගත් දේශපාලනයක් අපට අවශ්‍ය නැත .

20) එවැන්නක් ප්‍රජාතන්ත්‍රවාදයට අයත් නැති බව ද ප්‍රජාතන්ත්‍රවාදය මහත්වරුන්ගේ දේශපාලන ක්‍රමයක් විනා ඊර්ෂියාවන්තයිනට පිණුම් ගසන්නට ඇති කළ වේදිකාවක් නොවන බව ද දේශපාලනඥයින් තරයේ සිතට ගත යුතු ව තිබේ.

21) මේ සඳහා සියලූ ම දේශපාලනඥයින් හා නිලධාරීන් අවංක ව තම තමන්ගේ ආධ්‍යාත්මය නිසිලෙස ස්පර්ශකර පළමු ව තමා කවුදැයි තේරුම් ගත යුතු ව තිබේ.

22) මේ අනුව තමන්ගේ හැකියාවන් මෙන්ම දුර්වලතාවන් ද තේරුම් ගතහොත් පමණක් සත්‍යවාදී සත්‍ය ගරුක දේශපාලනඥයකු වන්නට අවකාශ සලසා ගත හැකිවන බවට සැක නැත.

23) එවිට මහජනතාවගේ ප්‍රශ්නවලට නිසැකව ම සංවේදී ව පිළිතුරු සපයා දෙන්නට අවස්ථා උදාකර ගන්නට හැකියාව ලැබෙනවාට ද සැකයක් නැත. එය අප කාහටත් ශාන්තියකි.

24) එසේ නම් ශ්‍රී ලංකාව සෞභාග්‍යවත් දේශයක් වශයෙන් නැවත ගොඩ නැංවීමේ කාර්ය භාරයට අතහිත දෙන්නට සෑම දේශපාලනඥයකු ම හා නිලධාරියකු ම ආණ්ඩු පක්ෂයෙන් සියල්ල කර දෙන තෙක් බලා නොසිට රටේ අනාගතය වෙනුවෙන් ඇප කැප වන්නට අදිටන් කරගත යුතුය.

25) මේ සඳහා දේශපාලන කෝන්තර අතහරින්න.

26) දේශ හිතෛෂියෙකු වන්න.

27) සංවර්ධනය අපේක්ෂා කරගෙන විවේචන කරන්න පොදු න්‍යාය පත්‍රයක් අනුගමනය නරන්න . එහි වරදක් නැත.

28) එහෙත් විනාශය ඇතිකරන්නට අහේතුක විවේචන නොකරන්නට ද වගබලා ගන්න. එය නිසැකව ම රටට ද මහජනතාවට ද සෙතකි.

29) කිසිදු දේශපාලන පක්ෂයකට, වෙනත් දේශපාලන මත දරන්නන්ට එරෙහි නොවන්නටත් වචනාර්ථයෙන් ම අහිංසාවාදී ව කටයුතු කරන්නට උවමනාවක් හා හැකියාවක් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට ඇත යන විශ්වාසය බහුතර මහජනතාවට තිබුණි.

30) පාර්ලිමේන්තුවට යන්නට මහජන අවසරය පතන වැඩි දෙනෙකුට මනාප ලැබෙන්නේ ජනාධිපති තුමා ලබා ඇති කීර්ති නාමය නිසා බව පාර්ලිමේන්තු මන්ත්‍රී අපේක්ෂකනයින් මන්ත්‍රීවරු ඇමතිවරු අමතක නොකළ යුතු ව ඇත.

31) ඒ නිසා අතිගරු ජනාධිපති තුමාගේ ගෞරවය ආරක්ෂාවන පරිදි ද කළ ගුණ සැලකීමක් වශයෙන් ද එතුමාගේ නායකත්වය දිදුලන පරිදි කටයුතු කිරීමේ වගකීම ද කාට කාටත් ඇත.

32) කවරකු ට වුවද බාහිර ව දකින පිළිවෙළ අනුව පක්ෂ විවිධත්වය නිසාගැටළු පවතින්නේ ය යන චෝදනාව ජනාධිපති තුමාට එරෙහි ව කළ හැකි ය.

33) එහෙත් ලබාගත් දේශපාලන පරිනත භාවය නිසා ද තම විශ්වාසනීය භාවය නිසා ද මෙතෙක් අත්දැකීම් තුළින් ලද අම්හිරි අත්දැකීම් නිසා ද පාක්ෂික එකමුතුවකට කැමති අයවලුන් තම දේශපාලන ගමන් මග ස්ථාවරකර ගැනීම සඳහා සමීපකර ගැනීම අනිවාර්ය ව තිබූ බව පැහැදිළි ය.

34) එසේ නොවන්නට දහසකුත් එකක් අසාධාරණකම් මධ්‍යයේ වුව ද බලමානය තුරන් කර ගන්නට ශ්‍රී ලංකාවේ ගමන් මග නව මාවතකට ප්‍රවේශ කරවීම කළ නොහැකි වන්නට ඉඩ තිබුණි.

35) එමෙන් ම දේශපාලනයේ නියුක්ත අය නව චින්තනයකින් අවදිකර ඔවුන් නිසි ලෙස දේශපාලන ක්‍රියාදාමයකට අවනතකර ගැනීම හා මෙහෙයවීම සැබවින් ම ප්‍රශංසා කළයුතු දෙයක් විනා ඊර්ෂියා සහගත ව ද්වේශ කළයුතු කරුණක් නොවේ.

36) එමෙන් ම එතුමා වටා එක්වූ වැඩි පිරිස රටට ජාතියට හිතවත් ව කටයුතු කරන ජවයකින් වැඩ කළ හැකි පිරිසකි

37) මෙම කරුණු සැළකිල්ලට ගෙන වැඩි දුරටත් බලය ලබා දිය යුතුද යන්න තීව්‍රකර ගන්නට අවශ්‍ය නම් ඒ සඳහා වැඩිදුර පිරික්සා බැලීමේ අයිතිය මහජනතාවටත් විරුද්ධ පක්ෂවලටත් නුදුරු අනාගතයෙව් දී ලබා දී තිබේ.

38) ඒ අනුව ඔවුන් කරන හරිදේ අගයන්නටත් වැරදි ඇත්නම් සාක්ෂි ඇති ව පෙන්වා දෙන්නටත් නුසුදුස්සන් ඉවත් කරන්නටත් මහජනතාව ඉදිරිපත්වන බව සිතිය යුතුය.

39) එමෙන් ම ප්‍රමාද දෝෂ වැරදි කා අතිනුත් සිදුවිය හැකි නිසා කරන සෑම දෙයක ම වැරදි පමණක් දැකීම සාධාරණ නොවන බව තේරුම් ගත යුතුය.

40) සැබවින් ම වැදගත් වන්නේ යහපත කරන පුද්ගලයා කාගේ කවුද යන්න නොව කරන ක්‍රියාව යහපත් ද අයහපත් ද යන්න ය.

41) සුපරීක්ෂාකාරී ව මෙම කරුණු අවධානයට ගත්විට පැහැදිළි වන්නේ අතිගරු ජනාධිපතිතුමා නිලය මත සිට නොව නිලයෙන් පහළට බැස ජනතාව අතරට පැමිණ ප්‍රශ්න හා ගැටළුවලට පිළියම් සොයන්නට තරම් පසුගිය කෙටි කාලය තුළ දී නිහතමානී ව ඇති බව ය.

42) එමෙන් ම දුකට වේදනාවට අසහනයට පත් යොවුන් පරපුර වෙනුවෙන් ද වෘත්තිකයින් මෙන්ම පොදු මහජනතාව වෙනුවෙන් ද

★ නැති බැරි සියලු දෙනා වෙනුවෙන් ද ප්‍රතිපත්ති සකස් කරමින් මහජනතාවගේ දුක සැප බලන්නට ඉදිරිපත්වන ස්වභාවයකින් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති තුමා කටයුතු කරන බව සුපරීක්ෂාකාරී ව බැලූවහොත් වටහා ගත හැකි ය.

43) යමකු මන්ත්‍රීවරයකු ඇමතිවරයකු වශයෙන් සාමය සෞභාග්‍ය විනය ගරුක බව අගය කරන්නේ නම් මහජන හිතවාදී මන්ත්‍රීවරයකු වශයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරන්නට සිතන්නේ නම් නොපැකිල ජනාධිපතිතුමාගේ හා අගමැති තුමාගේ කීර්ති නාමය ආරක්ෂා කරගත හැකි පරිදි ක්‍රියා කිරීමත් අවංක ව කටයුතු කිරීමත් වගකීමක් කොට සැළකිය යුතු ය.

44) මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මහජනතාවගේ ප්‍රශ්න හා ගැටළුවලට තාවකාලික පිළියම් ලබා දෙනු වෙනුවට තිරසාර විසඳුම් ලබා දෙන්නට පියවර ගතයුතු බව කල්පනාකර කටයුතු කරන ජනාධිපතිවරයෙකු බව මෙම දින කීපය තුළ දී මැනවින් සනිටුහන්කර තිබේ.

45) තමන්ට ම සුවිශේෂවූ දේශපාලන ගමන් මගක යමින් ජාතියේ පීතෘත්වයට සැබවින් ම ජීවය දෙන නායකයෙකු බව ද ඔප්පුකර ඇත.

46) ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය යලි කීර්තිමත් කරන්නට ජාත්‍යන්තරයේ හඩක් නගමින් නව විදේශ ප්‍රතිපත්තියක පිහිටා කටයුතු කරන්නට ද එතුමාට නව පියවර ද ගන්නට යොමු වීම ද අගය කළ යුතු ව ඇත.

47) ඒ සඳහා කැපවී කටයුතු කරන දේශ මාමක මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති තුමා කෘත ගුණ සලකන නායකයකු ද වන බව පසක් කර ඇති බව සිහිකළ යුතුය.

- ★ දයාබර දේශ මාමක බුද්ධිමතුනි, හිතාදර කලාකරුවනි,
- ★ නිලතල හොබවන සියලු නිලධාරිවරුනි,ගුරු භවතුනි,
- ★ ඔබේ බුද්ධිය දැනුම මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති තුමා ප්‍රමුඛ මැති ඇමතිවරුනට නිවැරදි දැක්මක් ඇති ව කටයුතු කරන්නට ප්‍රධානය කරන්න.
- ★ ජාතියේ සුරක්ෂිතතාව ඇතිකර දෙන්නට අතහිත දෙන්න.

48) එහෙත් අවධාරණයෙන් කිව යුතු ඉතා වැදගත් කරුණු කීපයක් තිබේ.

එනම් ජනාධිපති තුමාට හෝ මැති ඇමතිවරුනට සමීප වන්නට නිදහස් මතධාරීනට ඉඩකඩ ලබා නොදෙන පිරිසක් ඔබ තුමා ඇතුළු සියලු නායකයින් වටකර අරක් ගන්නා බව ය.

49) තමන් භුක්ති විඳින වරප්‍රසා ද අහිමිවන බවට ඇති බියෙන් මෙසේ කරනවා විය හැකි ය.

50) **ඊළඟ අවාසනාවන්ත කරුණ වන්නේ ලියා එවන අදහස් තමන්ගේ කරගෙන තමන්ගේ බව ප්‍රකාශ බොහෝ අය කටයුතු කිරීම ය. නැතහොත් අසත්‍ය ප්‍රකාශ කරමින් සැබෑ හිතවතුනට හා බුද්ධිමතුනට සමීපවන්නට ඉඩ නොදීම ය.**

51) මේ නිසා බොහෝ බුද්ධිමය සම්පත් රටට ජාතියට අහිමි ව ඇත.
දේශපාලන පක්ෂ කණ්ඩායම් පැළඳ කටයුතු නොකරන ස්වාධීන අදහස් මතවාද පළකරන පුද්ගලයිනට ඉඩ නොලැබෙන ලෙස මාර්ග අවුරා ඇත.

52) මේ නිසා අතිගරු ජනාධිපති තුමාට කිසිදු දේශපාලන පක්ෂ භේදයක් නොසලකා උගතුන් සහාය විය යුතුව ඇත.

52.01 සත්‍යවාදී ව සත්‍ය ගරුක ව මැදහත් සිතින් මූලික මහජන අවශ්‍යතා සපුරා දෙන්නට මෙතෙක් මේ දින කීපයේ දී ක්‍රියා කළ ආකාරයට වඩා සැලසුම් සහගත ව සියලු ම පාර්ශ්වයන් සමග එකමුතු ව කැපවී ක්‍රියා කරන්නට එතුමාට සියල්ලන් ම ශක්තිය ලබා දිය යුතු ව ඇත.

53) **පරිනත බවෙන් හැකියාවන්ගෙන් අනූන නිහතමානී දේශපාලනඥයකු ලෙස ක්‍රියා කරන එතුමාට තව දුරටත් ශක්තිය හා ප්‍රඥාව ලබා දීම කාගේත් යුතුකමකි.**

54) මෙහි දී අප අමතක නොකළ යුතු වැදගත් කරුණු සමූහයක් තිබේ.

එනම් වාද භේද දුරලන වැඩ පිළිවෙළක් ඇති ව සියලු පාර්ශ්වයන් සමග එකමුතු ව ක්‍රියා කරන්නට එතුමා සතු හැකියාව නිසා ම සාමකාමී දේශයක් ගොඩ නගාගන්නට රට තුළ වෙනසක් ඇති කරමින් ක්‍රියාකාරී දායකත්වයක් දක්වන්නට වර්තමාන ජනාධිපතිතුමාට හැකි ව ඇති බව ය.

55) ශ්‍රී ලංකාවට පමණක් නොව සමස්ත ලෝකයට ම සාමය ශාන්තිය උදාකර
දෙන්නට සමත්වන ආකාරයට දේශ හිතෛෂී වැඩ පිළිවෙළක් වැඩි දුරටත් පෝෂණය කරගන්නට වර්තමාන ජනාධිපති තුමාට අත හිත දිය යුතු ව ඇත.

56) එසේ නම් එතුමාට එරෙහි ව අඥානවත් ලෙස ඊර්ෂියා සහගත ව පටු පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා කටයුතු කරන්නට නොසිතිය යුතු ය.

57) අපි සෞභාග්‍යවත් ශ්‍රී ලංකාවක් අපේක්ෂා කරන විද්වතුන් වන්නේ නම් රට ගොඩ නගා ගන්නට අප ඉවසිලිවත් ව කටයුතු කළ යුතු වෙමු.

58) මහජනතාව කුපිත නොකළයුතු වෙමු.
එයට හේතුවක් තිබේ.එනම්

- ★ ශ්‍රී ලංකාව ගැනත් පුරවැසි පොදු මහජනතාව ගැනත්
- ★ ශ්‍රී ලංකාවේ දරු පරම්පරාව ගැනත්
- ★ අප ජීවත්වන මාතෘ භූමිය ගැනත්

★ ආගම ධර්මය ගැනත්

★ පොදුවේ මානව වර්ගයා ගැනත්

★ සැබෑ සෙනෙහසක් කැක්කුමක් ඇති ව දේශපාලන කෙෂ්ත්‍රයේ පරිනත අත්දැකීම් ලබා ඇති ආදර්ශවත් දේශපාලනඥයෙකු බව මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා විසින් සාධක සපයා ඇත

59) එතුමා පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලූ මැති ඇමතිවරුන් දිසාගත කරන්නටත් මග පෙන්වන්නටත් සිටිය යුතු නායකයෙකි.

60) ශ්‍රී ලංකාව යහමගකට යොමු කරන්නටත් දේශ දේශාන්තරවල ශ්‍රී ලංකා නාමය ප්‍රචලිත කරන්නටත් සමත් බුද්ධියක් ඇති උපන් හපන්කම් ඇති නායකයෙකි.

63) එතුමා පුද්ගලයකු වශයෙන් ආවේග මත සාහසික ක්‍රියා මත පදනම් කළ

★ වෛරය හා ද්වේශය පතුරුවන,හිංසාකාරී දේශපාලනයෙන් අත්මිදී සිටිමින්,

★ අහිංසාවාදියකු, සාම දූතයකු වශයෙන් ක්‍රියා කරන්නට සමත් ව ලෝක

පූජිත වූ මහින්ද රාජපක්ෂ ජනාධිපති තුමාට නොපැකිල සහාය විය යුතු නොවේද?

64) එතුමා සැබෑ ජනහිතකාමී,මානව හිතවාදී,ප්‍රජාතන්ත්‍රවාදී ගමන් මගකට පිවිස මෙම දින කීපය තුළ කටයුතු කර තිබේ.

65) එතුමා මෙම දින කීපය තුළ දී ජාත්‍යන්තරයේ ද සිත් දිනාගත්තා පමණක් නොව විරුද්ධවාදී මත ඉවසන්නෙකු බව ඔප්පුදර තිබේ.

66) වහසි බස් නොකියන, අවලා ද නොකියන අවලා ද ඉවසන පිරිසුදු දේශපාලන ගමනක යෙදෙමින් හරසුන් දේශපාලන පොරපිටියෙන් ඉවත් වන්නට සියලු දේශපාලනඥයිනට ඇවිටිලි කරමින් තමා ද ඒ සඳහා උත්සාහ ගන්නා නායකයෙකි.

67) එසේ නම් දැනට ශ්‍රී ලංකාවේ සිටින දේශපාලනඥයන් අතර මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති තුමා කුසලතා පූර්ණ පරිනත දැනුමකින් යුක්ත දේශපාලනඥයකු නොවන්නේ ද?

68) අවශේෂ නායකයිනගේ ආකල්පවලට පමණක් නොව සියලු මහජන අදහස්වලට ද උනන්දුවෙන්, ඉවසිල්ලෙන්, සාවධාන ව සවන් දෙන්නට මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති තුමාට ඉතා හොඳ ඉවසිලිවත් බවක් ඇති බව මෙතෙක් කළ කටයුතුවලින් පසක්කර දී ඇති බව ද අමතක නොකළ යුතු ව ඇත.

69) එපමණක් නොවේ සෑම දේශපාලනඥයකු විසින් ම එතුමා අධ්‍යයනයකර ආදර්ශ ලබා ගත යුතුය.

70) දේශපාලනඥයකු වශයෙන් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති තුමා ඊර්ෂියාව,කෝපය, ක්‍රෝධය, වෛරය, ද්වේශය,පළිගැනීම උද්දච්ච බව පසෙක දැමූ ප්‍රවේගකාරී ක්‍රියාකාරකම්වලින් අත්මිදුණු පහසුවෙන් මුළාවට පත්කළ නොහැකි දේශපාලනඥයෙකු බව පසක්කර ඇත.

71) අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ගේ චින්තනය ආයාසයකින් තොර ව වැළඳ ගත හැකිය . එහෙත් ලෝකයේ ඇති එක ම යහපත් චින්තනය එය පමණක් ලෙස සලකා අවශේෂ සියලූ දෙන ම නිසොල්මනේ සිටීම ද යුක්ති යුක්ත නොවේ.

72) මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති තුමා වැන්නකු ජනාධිපති ධුරයෙහි සිටීම කාලීන අවශ්‍යතාවක් බව ද අප සිහි කළ යුතුය.

73) එමෙන් ම මහජනතාව ත් රටත් යහ මගක යවන්නටත් ,මහජනතාවටත් රටටත් සහන ලබා දෙන්නටත්, සමාජ සාමය වෙනුවෙන් උපරිම දායකත්වයක් ලබා දෙන්නටත් ජනතාව වෙනුවෙන් රට වෙනුවෙන් ඇප කැප වී ක්‍රියා කරමින් එතුමා කර ඇති මෙහෙවර සුළුපටු නොවන බව සැමට සිහිවිය යුතුය.

74) මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති තුමා මහජනතාව ජාති ආගම් කුල වශයෙන් භේද කරන්නට, අසමගි කරන්නට බියෙන් ත්‍රස්ත කරන්නට ක්‍රියාකර නොමැත.



ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

75) මහජනතාවගේ ජීවිතවලට නව අරුතක් දෙන්නට පරිනත ක්‍රියාකාරී සැලැස්මක් ඇති ව ක්‍රියා කරමින් සිටින එතුමා, ජනතාව වෙනුවෙන් ලෙන්ගතු ව සැලසුම් සහගත ව ක්‍රියා කළ දේශපාලනඥයෙකි.

76) එවැන්නකු ආරක්ෂා කිරීම අපගේ යුතුකම ය.

77) විරුද්ධ චින්තනයන්ට සාවධාන ව සවන් දී සියලු මතවාද මනාව අවධාරණය කරමින් කටයුතු කරන්නට තරම් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති තුමා ප්‍රඥාවන්තයෙකු ව ඇත.

78) රට වෙනුවෙන් ගෞරවාන්විත මෙහෙවරක යෙදෙන්නටත් කටයුතු කරන්නටත් එතුමාට හැකිව ඇත.

79) එහෙත් එතුමා නොකැපු මැණික් වැනි හැකියා දක්ෂතා ඇති සියලු දෙනා ඉදිරියට ගෙන ශ්‍රී ලංකාවේ යහපත පිණිස ද මහජනතාවගේ යහපත පිණිස ද කටයුතු කරන්නට අවස්ථාව ලබා දීමට නව සැලසුම් සකස් කළ යුතු ව ඇති බව ද අවධාරණය කළ යුතුව තිබේ.

80) ඒ නිසා ඔබ දන්නා, ඔබ සිතන, නිවැරදි මගක් ඇත්නම්,

- ★ මහජනතාව වෙනුවෙන් ක්‍රියා කළයුතු යම් පිළිවෙළක් ඇත්නම්, එය නිවැරදි යැයි සිතන්නේ නම්,
- ★ වැඩි දෙනෙකුට වැඩි යහපතක් එයින් සිදුවේ යැයි සිතන්නේ නම්,

★ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති තුමාට ඒ මග ද හඳුන්වා දෙන්න.

81) ඔබත් රටත් වෙනුවෙන් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති තුමා මෙතෙක් අප්‍රතිහත
ධෛර්යකින් යුක්ත ව දැක්මක් ඇතිව ක්‍රියා කළ ආකාරයට මතුවටත් ක්‍රියා කරන්නට සැමකාම් ව සාමූහික ව අත දෙන්නට නිහතමානී වන්න.

82) දේශපාලනයෙහි නියැළී සිටින අවශේෂ පක්ෂවල අය ද සහභාගි කරගෙන රටට කීර්තියක් දිය හැකි අයුරින් කටයුතු කරමින් සිටීම ද අගය කරන්න.

83) මේ වනවිට මානව ගුණධර්මවලින් මිනිසුන්ට නව ජීවයක් දෙන්නට ද එතුමා ක්‍රියා කළ යුතු ව ඇති බව ද එතුමාට මේ මොහොතේදී ම සිහිකර දිය යුතුය.

84) ශ්‍රී ලංකාව ආදර්ශවත් දේශයක් බවට පත් කරන්නට අතිගරු ජනාධිපති තුමාට සජීවී ව දායකත්වයක් ලබා දීමේ දී නව අදහස් ද අවශ්‍යවේ.

85) එම නිසා ඔබත් ඔබේ ස්වර්ණමය අදහස් එතුමා වෙත ඉදිරිපත් කරන්න.

86) මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති තුමාට විනීත ව කටයුතු කරන්නට ත් අමාත්‍ය ධූර කීපයක් වුව හොබවන්නට තරම් ප්‍රවීනත්වයක් එතුමාට ඇත.

87) එම ප්‍රවීන කුසලතාවලින් වැඩි දුරටත් රට වෙනුවෙන් මෙහෙවරක යෙදෙන්නට ඉඩ ලබාදීම සඳහා ජනාදරයට පත් ව සිටින අවංක ව කටයුතු කළ හැකි මැති ඇමතිවරුනට සහාය ලබා දී මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති තුමාට සාමකාමී රටක් ගොඩ නගන්නට ශක්තිය ලබා දෙමු.

88) එතුමා සැබෑ අහිංසාවාදී ප්‍රජාතන්ත්‍රවාදියකු ද වන බව ද ආදර්ශවත් දේශපාලනඥයකු බව ද ප්‍රදර්ශනයකර ඇත.

89) සානුකම්පික ව පරාර්ථකාමී ව ඔබට ලෙන්ගතු ව සමීප වන්නට හා ඔබ වෙනුවෙන් ක්‍රියා කරන්නට එතුමා නිරතුරු ව සූදානම් ය.

90) එම වගකීම දරාගෙන ඔබ ව රැක බලා ගන්නට, ඔබ ව ආරක්ෂා කරන්නට, ඔබේ දරුවා යහමග යවන්නට, හැකි උපරිම මට්ටමින් ක්‍රියා කරන්නට මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති තුමා හැකියාව ලබා ඇත.

91) ලෝකයේ කිසිදු නායකයකුට එකවර සියලු ප්‍රශ්න විසඳීමට හැකිවී නැති බව මෙනෙහිකර අතිගරු ජනාධිපතිතුමාට විසඳුම් සොයා ගන්නට කල් දෙන්න.

92) එතුමා බුද්ධියෙන් මෙන් ම අත් දැකීමෙන් ලබා ඇති පන්නරය රටට ජාතියට ආශිර්වාදයක් ලෙස සලකා එතුමාගෙන් මැති ඇමතුවරුන් පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් පාඩම් ඉගෙන ගන්නටත් ආදර්ශ ලබන්නටත් උනන්දු විය යුතුව ඇත.

93) මහජන අදහස්වලට පෞද්ගලික ව සාවධාන ව සවන් දෙන්නට ලිඛිත සටහන් කියවා බලන්නට ඒ අනුව ප්‍රතිපත්ති තීරණ ගන්නට ජනාධිපති තුමාට සහාය වීමට වැඩි අවස්ථාවක් සලසා ගත යුතු ය.

94) අතිගරු ජනාධිපති තුමාට සිය කටයුතු පහසුකර ගන්නට සියලු මැති ඇමතිවරුන් ද නිලධාරීන් ද පක්ෂ විපක්ෂ සියලු මන්ත්‍රීවරුන් ද කැපවී කටයුතු කිරීම අවශ්‍ය ය.

95) ඉතා ම වැදගත් කරුණක් වන්නේ අතිගරු ජනාධිපති තුමාගේ කීර්ති නාමය ආරක්ෂාවන අයුරින් එතුමා මැදිහත්වන තෙක් බලා නොසිට ගැටළු ප්‍රශ්න විසඳන්නට මැති ඇමතිවරු හැකියාව ලබාගත යුතු ව ඇති බව ද සිහිකර දිය යුතු ව ඇත.

96) වහසිබස් නොකියන්නට අවලාද නොකරන්නට තර්ජන නොකරන්නට අනිසි ලෙස බලය පෙන්වන්නට හෝ බලය යොදවන්නට ඉදිරිපත් නොවී හැකිතාක් නිවුණු සිතින් නිවුණු වචනවලින් කතාකර ක්‍රියාකරන්නට මැති ඇමතිවරුන් මන්ත්‍රීවරුන් දැඩි අදිටනකින් ක්‍රියා කිරීම අතිගරු ජනාධිපති තුමා දිනාගත් කීර්ති නාමය ආරක්ෂා කරන්නට හේතුවන බව සිතන්න.

97) එතුමාට අනවශ්‍ය ප්‍රශ්නවලට මැදිහත්ව ක්‍රියා කර එතුමාගේ සිත කය වෙහෙසීමට පත් නොකරන්නට වගබලා ගැනීම කාලෝචිත ය.

98) දේශපාලනඥයෙකු වශයෙන් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති තුමා

★ සත්‍යවාදී සත්‍ය ගරුක හෘදයංගම ගති ඇති

★ සතුරන්ට පවා මානව ගුණයෙන් සලකන ඔවුන් ඉවසන,

★ මිනිසකු ව මිනිසකු ලෙස පිළිගන්නා,

★ මිනිසකුට මිනිසකු ලෙස සලකන,

★ මිනිසකුට මිනිසකු ලෙස ගරු කරන,

★ මිනිසකු මිනිසකු වශයෙන්
ආරක්ෂා කරන,

★ එතුමාගේ ජීවිතය උපමා කොට මහජනතාව ගැන සිතන්නට තරම් නිහතමානී මිනිසෙකු වූ මෛත්‍රීපාල සිරිසේන
ජනාධිපති තුමා කෙරෙහි අප තවදුරටත් විශ්වාසය තබමින් එතුමාට උදව් කිරීම යහපත් හෙට දිනකට ආශිර්වාදයක්වන බවට සැකයක් නැත.

99) දුකට වේදනාවට, ගැටළු ප්‍රශ්නවලට මෙතෙක් පිළිතුරු නොල ද සියලු පුරවැසි හිතවතුනි,ඔබත් විශ්වාසයෙන් යුතු ව එතුමාට සමීප වන්න.

100) අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන තුමාණන්
ඔබට දිගු කළ පිරිසිදු දෑතට
ඔබගේ දෑත් පිරිසිදු කරගෙන
දිගු කරන්නට
නිහතමානී වන්න.
ජනාධිපති තුමනි ඔබතුමා වෙනුවෙන්
පොදු ජනතාවට දෙන පණිවිඩය

## 2010 ජනවාරි මස දී මීට පෙර සිටි
## ජනාධිපති තුමාට ද ලියන ලද පණිවුඩයකි

සත්‍ය, අර්ථ, නාමෙන් සාමයෙ මෙත් මල්
ගෙනෙමින් මගක් පාදමි සිතකින් නොකැළැල්
රට දැය නගමු පතුරා සමගියෙ හසරැල්
විකසිත කරමු හද තුළ ආසිරි මෙත් මල්

දෙදහස් පහළොවත් දැන් ගෙවෙන ව ඔන්න
නව මං තැනුවෙ හෙළ දෙරණ ම පුබුදන්න
රට දැය නගා සාදුක නැතිකර ගන්න
එකාවන් ව නව මගකට පිවිසෙන්න

දැන්වත් සබඳ ඔබගේ සිත දිරිවත් ද?
හැම මොහොතක ම රට දැය ගැන හිතනව ද?
මතු පරපුරට ඔබ යහපත කරනව ද?
ජනපතිඳුන්ට ඔබ ශක්තිය දෙනවාද ?

ජනපති මෛත්‍රී සාමය රැගෙන ඇවිත්
සාමයෙ සතුට අපෙ හදවත් වෙතට ඇවිත්
සොබා දහම අප සමගින් පෙරට ඇවිත්
ශ්‍රී ලංකාවෙ සමගිය පෙරමුණට ගෙනත්

බොදු මග යන්න බුදුගුණ වඩවා ගන්න
යති දම් අසා ඔබෙ සිත සනසා ගන්න
මෙත් සිත් පතුරුවා සතහට සුව දෙන්න
යතිවරු දෙසූ දහමෙන් ඔබ පිබිදෙන්න

ජනපති තුමා සිරිලක අපෙ බුදු සසුන
සුරකින්නේ ය ලෝකෙට සුව ගෙන දෙන්න
අපටත් අපේ හෙළබිම පීවත් යන්න
ජනපති තුමා යන මග නොබියව යන්න

පෙන්වන්නටයි සිරිලක් මැණිගෙ අගය
වගකීමකින් අපගේ ශ්‍රී විභූතිය
ලොවට ම හෙළි කළේ ජනතාවගෙ බලය
එම මග යන්න අප එඩිතර විය යුතුය

සිත කැළඹිලා දුක දොම්නස ආවෝතින්
යන්නට එපා නොමගට ඔබ ගැටුම් මැදින්
ගැටළු ද ප්‍රශ්න නොතකා හොඳ වැඩ කරමින්
රැක ගෙන රටට විසඳුම් ලැබ ගන්න හොඳින්

වෛරය තුරන්කර අප තැන්පත් විය යුතුය
ලැබූ සහන රටට ම අප දිය යුතුය
අපෙ දිවි රැකෙන්නට රට රැක ගත යුතුය
මතු පරපුරට සාමය රැක දිය යුතුය

සාමය දිනා ගන්නට හිතවත් සබඳ
සේවය උතුම් වැටුපට වැඩියෙන් සබඳ
නොදැනී වුණත් සිදුවූ වරද නිවරද
කර ගන්නටයි ඇරයුම හැමට ම සබඳ

බක් මාසයේ අවුරුදු අප වෙත එනවා
වැඩිහිරි සැමට ආසිරිමල් පුද දෙනවා
රට ගොඩ නගන්නට දැන් අප සැරසෙනවා
නව ජන බලෙන් අපෙ රට තව බැබළේවා

සහයෝගයෙන් සාමෙන් වැඩ කරන්නට
ඔබෙ සිත දිරිවත් ද? රට දැය නගන්නට
හැම මොහොතක ම සාමය රැක දී රටට
දිරියක් වන්න හැකිවෙද රටට ම ඔබට

සිතිවිලි පෙළ ගැසී ඇත යහ පාලනය
රටට සෙත සදන්නට කැප වුවොත් හොඳය
නැණවතුන් ගුණවතුන් රටට අභිමනක්ම ය
දෙන්න රටට ම ජවය එයයි අපගේ සවිය

රට දැය අපෙයි කැප වී වැඩ කරමු අපි
ජනපති දැත නිති සවිමත් කරමු අපි
රට දැය නගන්නට හැම බල දෙමින් අපි
සැකයක් නොමැත නියත ව රැකදේවි අපි

සාමයෙ පරෙවියා අද ළඟ හිටියාට
සමගිය රැක දෙමින් රට ගොඩ නගන්නට
සැමදා ඔබත් ජනපතිඳා ඔබ ළඟට
කැඳවා ගන්න නොපැකිල අත හිත දෙන්ට

සෙනෙහෙ සිතින් ඔබ හට අමතන එතුමා
සාමයෙ සතුට ඔබ හට ලැබ දෙන එතුමා
යහ පාලනය අපවෙත ගෙන එන එතුමා
රට දැය නගයි ජනපතිකම ලද එතුමා

ජනපතිකම රැකදීලා මෛත්‍රී නම රැක ගත්ත ම
රට රකින්න උතුම් පුතුන් වැඩි වැඩියෙන් බිහි කළා ම
ශ්‍රී ලංකා මැණියන්ගෙ දරුපරපුර දිනෙව්වා ම
ආසියාවෙ දිදුලන රට කළ හැක සිරි ලංකාව ම

සම්බුදු සරණින් දෙවි රැකවරණින්
මෛත්‍රී ජනපති නම් මැතිඳුන්
දීඝායු ලබමින් ජය ලැබ ගණිමින්
වැජඹේවා ආසිරි ලබමින්

ජය ජය ජය ජය ජය වේවා
මෛත්‍රී මැතිඳුට ජය වේවා
මෛත්‍රී නම නිති බැබළේවා
රට දැය නගන්න හැකිවේවා

තෙරුවන් සරණත් ලැබ දෙන්නයි
දෙවි රැකවරණත් ලැබ දෙන්නයි
ජනපති මැතිඳා රැක දෙන්නයි
රටට ම සුව සැප ගෙන දෙන්නයි

තෙරුවන් සරණත් ලැබ දෙන්නයි
දෙවි රැකවරණත් ලැබ දෙන්නයි
අගමැති මැතිඳා රැක දෙන්නයි
රටට ම සුව සැප ගෙන දෙන්නයි

සියලු බාධක දුරුව යන්නයි
සුබ අනාගතයක් ලැබෙන්නයි
සුවය සහතුට නිති ලැබෙන්නයි
රටට සාමය උදා වෙන්නයි

සියලු බෙලෙන් බැබලේවා ජනපති කිතු ගොස නාමය
තෙරුවන් සරණින් මැතිඳුට ජය හිමි වෙනවා නියතය
අගමැති හොඳ කරනා බව හැමට ම සඳහට මතක ය
ජය ලැබුවොත් රටට ම සෙත සැදෙනා බව නම් නියතය

දෙවි පිහිටෙන් බැබලේවා - මෛත්‍රී නම් ගරු නාමය
කළ හොඳ නිසා මෛත්‍රී නම - අපහට සඳහට මතකය
ජන බලයෙන් මතුවට ජය - හිමිවන බව නම් නියතය
ජය ලැබුවොත් අනාගතය සරුවන බව නම් නියතය

දෙවියනි කතරගම විෂ්ණු ද ගණපති ද
සතරවරම් දෙවිවරු මේ හැමගේ ද
දෙපා නැමද බැතියෙන් ඉල්ලන්නෙ අද
රැක දෙන ලෙසයි ජනාධිපති මෛත්‍රී ද

බුදු සසුන මහජන යහපතට යොදවා ගන්නට නම්

උක්ත කරුණ සම්බන්ධයෙන් පෙර සිටි ගරු අග්‍රාමාත්‍ය තුමා වෙත යොමු කරන ලද ලිපිය මේ සමග දැන ගැනිම හා අවශ්‍ය කටයුතු සඳහා එවා ඇත. එතුමාට යවන ලද ලිපිය ෆැක්ස් මාර්ගයෙන් ද යවා ඇතත් කිසිදු පිළිතුරක් නොලැබුණි. මෙම ලිපිය ඔබ තුමා හෝ අවධානයට ගැනීම වැඩදායක වේ යැයි හඟිමි. කාරුණික ව ඔබතුමා හෝ කියවා බලන්න.

සුහදතාවෙන් බැඳී

ආචාර්ය ධම්මික පියතිස්ස බිබිලේ
හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
නිර්මාතෘ විශ්වාන්තර විවේකාශ්‍රමය
සත්‍යාර්ථ සාම පුවර්ධන සමාජය
ළමා නිකේතන පර්යේෂණ හා සංවර්ධන පුහුණු ආයත

සත්‍යාර්ථ සාම ප්‍රවර්ධන සමාජය හඳුනාගත් දර්ශනයේ තේමාව සත්‍ය අර්ථ සාම යන සංකල්ප තුන මත පදනම් ව ඇත.

අප වෙහෙසෙන්නේ සත්‍ය ගරුක වෙමින් සත්‍ය සොයා යන්නටත් අන්‍යයන්ට අප හඳුනාගත් සත්‍ය පෙන්වා දෙන්නටත් ය.

2600 බුද්ධ ජයන්තිය නිමිති කරගෙන ඔබ තුමා බෞද්ධ ධර්මයෙහි ඇතුළත් සත්‍ය ය ලෝක ජනතාවට හඳුනා ගන්නට ඉඩ සලසමින් බෞද්ධ ප්‍රබෝධය පිණිස කටයුතු කිරීම අතිශයින් කාලෝචිත ය.

අතිශයින් අගය කළ යුතු ය.

එහෙත් බුද්ධ ධර්මය වර්තමානයේ දී භාවිතයට ගනු ලබන්නේ ද බුද්ධ ධර්මය තවමත් ව්‍යවහාරයට ගනු ලබන්නේ ද හුදෙක් ආමිස පූජාවට මුල් තැනක් ලබා දෙමින් ය.

සංස්කෘතිකාංග පමණක් අගය කරමින් ය.

බණ දහම් වුව ද දේශනා කරනු ලබන්නේ ද විවිධ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනු ලබන්නේ ද සාම්ප්‍රදායික ක්‍රමයට නිසා බුද්ධ ධර්මයෙන් මානව වර්ගයාට අත්කර ගත හැකි ව ඇති ප්‍රතිඵල අල්ප වී ඇත.

සියලු ආගම් සම්බන්ධයෙන් ද මෙම ප්‍රවේශය අදාළ කිරීම අවශ්‍ය වේ.

1) මේ නිසා වර්තමානයේ පැන නැගී ඇති
පුද්ගලයා හා සම්බන්ධ ගැටළු,
පවුල හා සම්බන්ධ ගැටළු,
දුරාචාර පිටුදැකීම සම්බන්ධ ගැටළු
රටවල් හා ලෝකය පිළිබඳ අන්තර් ජාතික ගැටළු, හෝ
භික්ෂූන් වහන්සේලා හා සාසනය සම්බන්ධ ගැටළු
යනාදිය විසඳා ගැනීමේ දී
තවමත් විශාල පසු බෑමක් ඇති බවට බොහෝ සාධක දක්නට ඇත.

2) අද බුදු දහම ඇදහිල්ලකට සීමා වෙමින් ඇත් ද යන ප්‍රශ්නය අප ඉදිරියෙහි ඇත.

3) සංස්කෘතික හර පද්ධතියක් සුරකින ආමිස පූජාව ප්‍රමුඛ කරගෙන කටයුතු කරමින් පවත්නා ආගමකට බුදු දහම සීමා වෙමින් තිබේ ද යන්න ද ප්‍රශ්නයකි.

4) බුදු සසුන බබළවන්නට භික්ෂූන් වහන්සේලා ඇතුලු බාල, තරුණ, මහළු, සියලු
බෞද්ධයින් ද
දේශපාලන නායකයින් ද
පරිපාලකයින් හා ප්‍රජා නායකයින් ද
විශේෂයෙන් දේශපාලන නායකයින් ද
සැබෑ බෞද්ධ ප්‍රතිපත්ති හඳුනාගෙන බෞද්ධ ප්‍රතිපත්ති අනුව ජීවත්වන්නවුන් බවට පත්විය යුතුවේ.

5) ඒ සඳහා බෞද්ධ මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනයට ප්‍රමුඛත්වය ලබා දෙමින් නව වැඩ පිළිවෙළක් සකස් කළ යුතුව තිබේ.
(දැනටමත් යම්තාක් දුරට සකස්කර ඇත).

6) අවශේෂ ආගම් සියල්ල ද තනි නොකර ඔවුන්ගේ අරමුණු හා ක්‍රියාකාරකම් බෞද්ධ විරෝධී හෝ අවශේෂ ආගම් විරෝධී නොවන ලෙස පවත්වා ගෙන යන්නට මගපෙන්විය යුතුව තිබේ.

7) අවශේෂ ආගම් ඔවුන්ගේ ආගම් තුළ මුල් බැසගත් මානව ගුණ ධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා වන වැඩ පිළිවෙළට මූලිකත්වය දෙමින් ක්‍රියාකාරී වන්නට යොමු කළ යුතුවේ.

8) මේ මගින් පුද්ගලයා තුළ සාමය, පවුලේ සාමය රටේ සාමය රටවල් අතර සාමය සඳහා ද ලෝක සාමය සඳහා ද වැඩ පිළිවෙළ සකසා ගත හැකි ය.

9. බුද්ධ ධර්මය හා බැඳි පවත්නා මතවාද ඉවසීම හා එම මතවාද අතර එකඟතා ඇතිවන ලෙස විනා මතභේද ඇතිවන ලෙස ක්‍රියා නොකරන්නටත් නිකාය භේද ධර්මය හා සම්බන්ධ මතභේද සමථයට පත් කිරීමටත් කටයුතුකර බෞද්ධ ජනතාව එක්සේසත් කිරීම අත්‍යාවශ්‍ය ව තිබේ.

10. පාසල් තුළ මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය හා සම්බන්ධ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම බාල පරපුර විනය ගරුක අනාගත පුරවැසියන් බවට පත් කිරීමට අත්‍යාවශ්‍ය ය.

11. දේශපාලනඥයින් සඳහා මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය හා සම්බන්ධ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම ද අත්‍යාවශ්‍ය වේ.(සකස්කර ඇත ).

12. පරිපාලකයින් සඳහා මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය හා සම්බන්ධ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම ද අවශ්‍ය ය.(සකස්කර ඇත )

13. දහම් පාසල් තුළ මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය හා සම්බන්ධ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම ද විෂය මාලා මේ අනුව නැවත සංශෝධනය කිරීම ද කළ යුතු ව තිබේ.(සකස්කර ඇත )

14. සෑම පාසල් හා දහම් පාසල් විෂයයක් තුළින් ම මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය හා සම්බන්ධ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට රුකුල් ලැබෙන ආකාරයට විෂය මාලා සංශෝධනය කිරීම අවශ්‍ය ය.

15. මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය හා සම්බන්ධ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට උචිත ලෙස ගුරු පුහුණුව විධිවත් කිරීම ද අත්‍යාවශ්‍ය ය. (සකස්කර ඇත )

16. සියලු ආරක්ෂක අංශ සඳහා මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය හා සම්බන්ධ මූලික දැනුමක් ලබා දී සුදුසු වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම.(මීට පෙර පුහුණු කටයුතුකර තිබේ).

17. විශ්ව විද්‍යාල තුළ පාසල් තුළ මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය හා සම්බන්ධ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම.

18. විදේශික සංචාරකයින් සඳහා බෞද්ධ මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය හා සම්බන්ධ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම.

19. භික්ෂූන් වහන්සේලාට බෞද්ධ උපදේශනය පිළිබඳ පුහුණුවක් ලබා දී දහම් දෙසීම පිළිබඳ පුහුණුවක් ලබා දෙන වැඩ පිළිවෙළක් සැකසීම.

20. මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා උසස් අධ්‍යාපනය ලබා දීමට දේශීය විදේශීය ශිෂ්‍යයින් සඳහා වෙන්වූ විශ්ව විද්‍යාලයක් ජාත්‍යන්තර සහයෝගය ඇති ව පිහිටුවීමට වැඩ පිළිවෙළ සැකසීම.
(විශ්වාන්තර විවේකාශ්‍රමය යටතේ දැනට මේ සම්බන්ධ වැඩ පිළිවෙළ සකසමින් ඇත .එහෙත් මෙම කටයුතු කරන්නට නියමිත තැනක් නැත.)

21). පාසල් හා විශ්ව විද්‍යාල පාඨමාලා සංශෝධනයකර මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය හා සම්බන්ධ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම යුහුසුළු ව කළ යුතු ව තිබේ.

22) බුදු දහම හැදෑරීමටත් අවශේෂ ආගම් හා දර්ශනවල ඇතුළත් මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය හා සම්බන්ධ අධ්‍යයනයන් කරන්නටත් විදේශ ශිෂ්‍යයිනට හා විද්වතුනට වැඩි වැඩියෙන් අවකාශ සලසා දීම ද අවශ්‍ය ය.

23) ආගමෙන් තොර මානව ගුණ ධර්ම ද ආගම් හා සම්බන්ධ මානව ගුණ ධර්ම ද මතුකර ගනිමින් අවශේෂ රටවල ද ඒවා ප්‍රචලිත කිරීමට සත්‍යාර්ථ සාම ප්‍රවර්ධන සමාජයට අවකාශ ලබා දෙන්න.

24) තානාපති කාර්යාල හා අනුබද්ධ ව ලෝක සාම වැඩ පිළිවෙළක් දියත් කිරීම සඳහා ක්‍රියා කිරීම ද අවශ්‍ය වේ.

25) දේශීය හා විදේශීය සියලු බෞද්ධ සංවිධානවල එකමුතුවක් ගොඩනැගීම හා මූලස්ථානය ශ්‍රී ලංකාවේ පිහිටුවීමත් 'අවශ්‍ය ය.

26) දේශීය දැනුම බල ගැන්වීම සඳහා ව්‍යාපෘති ආරම්භ කිරීමත් අවශ්‍යවී තිබේ.

27) සිංහල විශේෂ කොට පාලි හා සංස්කෘත භාෂා ලෝක ව්‍යාප්ත කිරීම සඳහා පුළුල් වැඩ පිළිවෙළක් ආරම්භ කිරීම ද කාලීන අවශ්‍යතාවකි.

28) ආගමික ගුරුවරුන් පුහුණු කිරීම සඳහා පිහිටුවනු ලබන සමයාන්තර විශ්ව විද්‍යාලය තුළ (විශ්වාන්තර

විවේකාශ්‍රමය)ගුරු පුහුණුව සඳහා ගුරු පුහුණු අධ්‍යයන පීඨයක් ඇති කිරීම.

29) විදේශ රටවල මෙම සමයාන්තර විශ්ව විද්‍යාලය හා අනුබද්ධිත විශ්ව විද්‍යාල පිහිටුවීම.

30) විදේශ රටවල බෞද්ධ තොරතුරු හා ශ්‍රී ලාංකික ශ්‍රද්ධානය බල ගැන්වීමේ සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීම.

31) ශ්‍රී ලංකාව තුළ ඉංග්‍රීසි භාෂාව පමණක් ප්‍රචලිත කරන්නට සීමා නොවී රුචිකත්වය හා හැකියාව ඇති ඕනෑම කෙනෙකුට පෙර අපර දිග ඕනෑම භාෂාවක් ඉගෙනීම සඳහා පහසුකම් සලසා දීම.

32) විහාරස්ථාන දේවාල සංවර්ධනය කිරීම සඳහා ද ආදායම් නොමැති විහාරස්ථාන සංවර්ධනය සඳහා ද නව වැඩ පිළිවෙළක් දියත් කිරීම.

33) සෑම ආගමික ස්ථානයක් ම දේශීය විදේශීය වන්දනාකරුවනට විවෘත ස්ථාන බවට පත් කරන අයුරින් පහසුකම් වැඩි දියුණු කිරීමට යාන්ත්‍රණයක් සැකසීම.

34) දුරාචාර අධෛර්යවත් කිරීම සඳහා සියලු ආගමික ස්ථාන කේන්ද්‍රකර ගනිමින් නව වැඩ පිළිවෙළක් දියත් කිරීම.

35) සියලු ම ආගම්වලින් තෝරාගත් පූජ්‍ය පූජක පක්ෂයට උපදේශනය,ගැටුම් නිරාකරණය,ආපදා කළමනාකරණය හා

සාම අධ්‍යාපනය පිළිබඳ ව පුළුල් ප්‍රායෝගික දැනුමක් හා පුහුණුවක් ලබාදීම.

36) වැඩිහිටියන් සඳහා දහම් පාසල් පිහිටුවීම, පවත්වාගෙනයාම, හා විෂය මාලාවක් පිළියෙල කිරීම. (අවශ්‍ය කටයුතු සකස් කරමින් ඇත).

37) දේශීය හා විදේශීය දසසිල් මාතාවන් හා මෙහෙණින් වහන්සේලා සඳහා පිරිවෙන් කීපයක් හෝ පිහිටුවීම හුවමාරු වැඩසටහන් ඇති කිරීම.

38) පිරිවෙන් අධ්‍යාපනය සඳහා නව විෂයමාලාවක් පිළියෙලකර දේශීය විදේශීය පිරිවෙන් ගුරුවරුන් සඳහා ගුරු පුහුණුව ලබා දීම.

39) විදේශ රටවල පිරිවෙන් පිහිටුවා පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය විදේශයන්හි ප්‍රචලිත කිරීම.

40) පොලිසිය පන්සල හා පාසල අතර සම්පස්ථ බව වැඩි දියුණුකර මෙම ආයතන තුන කේන්ද්‍ර කර ගනිමින් මානව ධර්ම ප්‍රවර්ධන හා ආධ්‍යාත්මික සංවර්ධනය සඳහාවන වැඩ සටහන් දියත් කිරීම.

41) දේශීය හා විදේශීය භික්ෂූන් හා භික්ෂුණීන් වහන්සේලා හුවමාරුකර ගැනීමේ වැඩසටහන් ආරම්භ කිරීම.

42) ධනවත් ව්‍යාපාරිකයින් හා විදේශ පරිත්‍යාගශීලී ධනපතියන් හා බෞද්ධ සංවිධාන ඒකාබද්ධ කොට දුප්පත් අසරණ බෞද්ධයින් සඳහා සුබසාධන වැඩ සටහන් ආරම්භ කිරීම.

43) සියලු ම බෞද්ධ සමිති සමාගම් ඒකරාශිකර සම්මේලනයක් හා සම්බන්ධීකරණයක් ඇතිකර, කාලෝචිත වැදගත් කාර්යයන් සඳහා සෙන ප්‍රමුඛතා ලැයිස්තු සකසා තම තමන්ගේ හැකියාව හා සම්පත්වලට අනුව කාර්යයන් වෙන වෙන ම පවරා ගෙන ලෞකික හා ධාර්මික වැඩ පිළිවෙළක් සැකසීම.

44) කෙටිකාලීන, මධ්‍යකාලීන හා දීර්ඝකාලීන වශයෙන් මානව ගුණධර්ම සංවර්ධනය හා ආධ්‍යාත්මික සංවර්ධනය ප්‍රමුඛ කරගත් වැඩ පිළිවෙළ හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම.

45) සිරගත වුවන් සිර ගෙයින් නිදහස් ව ගම්බිම් බලා යන්නට පෙර ආගමික ස්ථාන ආශ්‍රය කරගෙන දහම් අධ්‍යාපනය ලැබීම වැඩිහිටි දහම් පාසල්වල ඉගෙනීම ආගමික ස්ථාන වෙත පැමිණ උපදෙස් ලබා ගැනීම අනිවාර්ය කිරීම.

46) සියලු ම ආගම් මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය සම්බන්ධයෙන් ප්‍රමුඛත්වය ගෙන ක්‍රියා කිරීමට පෙළගැස්වීම හා පුහුණුව ලබාදීම.

47) බෞද්ධ ශාසන කොමිශන් සභා පනත සංඝාධිකරණ පනත නැවත සලකා බැලීම හා නව බෞද්ධ ජන සංරක්ෂක වැඩ පිළිවෙළක් සැකසීම.

48) බෞද්ධයන් සඳහා බෞද්ධ නීති ක්‍රමයක් සැකසීම.

49) රාජ්‍යපාලකයිනට අවවාදානුශාසනා කිරීම සඳහා ත්‍රෛ නිකායික මහා නාහිමිවරුන්ගේ නායකත්වයෙන් රාජ්‍ය අවවාදානුශාසනා මණ්ඩලයක් පිහිටුවීම.

50) මහානාහිමිවරුන්ගේ ප්‍රධානත්වයෙන් බෞද්ධ භික්ෂූන් වහන්සේලා සඳහා විනය පාලක මණ්ඩලයක් පිහිටුවීම.

51) වාර්ෂික ව ත්‍රෛනිකායික භික්ෂුන් වහන්සේලා සඳහා පළාත් මට්ටමින් හා ජාතික මට්ටමින් සංගායනා සම්මන්ත්‍රණ පැවැත්වීම.

52) දළදා මාළිගාවේ දියවඩන නිළමේ තුමා ද ත්‍රෛ නිකායික භික්ෂූන් වහන්සේලා ද ප්‍රමුඛ කරගෙන ජාතික මට්ටමේ විද්වත් බෞද්ධ මණ්ඩලයක් පිහිටුවීම.

53) සර්ව ආගම්වලින් සැකසුන ජාතික මණ්ඩලයක් පිහිටුවීම.

54) සිංහල, පාලි,සංස්කෘත, භාෂා මළ භාෂාවන් බවට පත්වන්නට ඉඩ නොදී ජාත්‍යන්තරයට ගෙන යාමේ වැඩ පිළිවෙළක් දියත් කිරීම.

55) ජාත්‍යන්තර බෞද්ධ සංස්කෘතික පර්යේෂණ ආයතනයක් පිහිටුවීම හා මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය සම්බන්ධ පර්යේෂණ සඳහා ප්‍රමුඛත්වය දීම.

56) තානාපති කාර්යාල ආශ්‍රය කරගෙන ජාතික හර පද්ධතීන් ජාත්‍යන්තරයට ගෙනයාමේ වැඩ පිළිවෙළක් ආරම්භ කිරීම.

57) සියලු විහාර දේවාලගම්වල ආදායම් ඒකරාශිකර අරමුදල් පරිහරණය විධිවත් කිරීම.

58) අවශේෂ එක් එක් ආගම් සම්බන්ධයෙන් ද ජාතික අරමුදල් පිහිටුවා අධීක්ෂණය කිරීම.

59) දුප්පත් හෝ අසරණ බවට පත් බෞද්ධයින් සඳහා ජාතික හා ජාත්‍යන්තර සරණාගත අරමුදලක් වෙනම පිහිටුවීම.

60) වැසීයන විහාරස්ථාන ආදායම් රහිත විහාරස්ථාන හා අවශේෂ ඇති හැකි විහාරස්ථාන අතර සබඳතා තරකොට සාසනාරක්ෂක බලමණ්ඩල බල ගන්වා ඒවා තුළින් සංවර්ධන වැඩ සටහන් ආරම්භ කිරීම.

61) විදේශ රටවල විහාරස්ථාන සමග දේශීය විහාරස්ථාන යා කිරීමේ වැඩ සටහනක් දියත් කිරීම.

62) පොහෝ දිනවල හා අවශේෂ තෝරාගත් දිනවල ක්‍රියාත්මක කිරීම සඳහා විහාරස්ථානවල විධිවත් වැඩ සටහන් ක්‍රියාත්මක කරන්නට වැඩ පිළිවෙළක් හඳුන්වා දීම.

63) තෝරාගත් විශේෂ දිනවල හා පොහෝ දිනවල විදේශ විහාරස්ථානවල ශ්‍රී ලංකාවේ වැඩ සටහන්වලට සමගාමී ව

ප්‍රායෝගික වශයෙන් වැඩදායකවන වැඩ සටහන් ක්‍රියාත්මක කරන්නට වැඩ පිළිවෙළක් හඳුන්වා දීම.

64) විදේශ විශ්ව විද්‍යාලවල සිංහල, පාලි ,සංස්කෘත මෙන්ම දේශීය ශාස්ත්‍ර ,බලගැන්වීමේ සංස්කෘතික කේන්ද්‍ර හෝ අංශ පිහිටුවීමට කටයුතු කිරීම.

65) මෙම සියලු කාර්යයන් සඳහා පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩ පිළිවෙළක් අප්‍රමාද ව ආරම්භ කිරීම.

මෙම කරුණු පිළිබඳ ව ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන අතර අතිගරු ජනාධිපති තුමා ද දැණුවත්කර ඔබ තුමාගේ නායකත්වයෙන් මෙම වැඩ පිළිවෙළ දියත් කිරීම යෝග්‍ය ය.
මේ පිළිබඳ ව සාකච්ඡා කිරීමට අවස්ථාවක් ලබා දෙන ලෙස ඉතා කාරුණික ව ඉල්ලා සිටිමි.

මෙයට විශ්වාස

ආචාර්ය ධම්මික පියතිස්ස බිබිලේ
හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
නිර්මාතෘ විශ්වාන්තර විවේකාශ්‍රමය
සත්‍යාර්ථ සාම ප්‍රවර්ධන සමාජය
ළමා නිකේතන පර්යේෂණ හා සංවර්ධන පුහුණු ආයතනය

ඇමුණුම

දැනට මවිසින් සකසා ඇති

පාඨමාලා කීපයක

පිටපත් පමණක්

දැන ගැනීම සඳහා

මේ සමග එවා ඇත.

★ මෙහි ඇතුළත් දෑ ක්‍රියාත්මක කරන්නට අදාළ ක්ෂේත්‍ර පිළිබඳ මනා දැනුමක් හා හදවත් ඇති අය පමණක් සම්බන්ධකර ගන්නා ලෙස ඉතා කාරුණික වී ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමි.

★ මෙතෙක් කාලාන්තරයක් මුළුල්ලේ විවිධ මැති ඇමතිවරුනට මන්ත්‍රීවරුනට නිලධාරීනට දෙන ලද කිසිවකින් නිසි ඵලයක් ලබා ගෙන නැත.

★ අවම වශයෙන් කියවා බලන්නට අදහසක් ප්‍රකාශ කරන්නට හෝ ලැබුණු බව දන්වන්නට හෝ නිහතමානී වී නැති බවට අදහසක් දැන් මා තුළ පහළ වී ඇත.

★ එහෙත් දෙන ලද අදහස් උකහා ගෙන හෝ පිටපත් කරගෙන අතරමංවන බව ද දක්නට ලැබේ.
අතිගරු ජනාධිපති තුමනි මෙම මනුෂ්‍ය දුර්වලතා අවමකර ගන්නට අප සැළකිලිවත් වීම අත්‍යාවශ්‍ය යැයි සිතමි.
මා විසින් කර ඇත්තේ යථාර්ථය හෙළි කිරීමක් පමණකි.

# මානව ධර්ම ප්‍රවර්ධනය හා ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා අධ්‍යාපනය (දේශපාලනඥයින් සඳහා පාඨමාලාව)

| | | |
|---|---|---|
| (1) | මානව ධර්ම මොනවාදැයි හඳුනා ගැනීම | පැය 60 යි |
| | පෙර විමසුම | පැය 3 |
| 1.01 | මානව ධර්ම සාරධර්ම සදාචාරය හා චර්යා ධර්ම | පැය 12 |
| 1.02 | මානව ධර්ම යන්හි මනෝවිද්‍යාත්මක පදනම | පැය 6 |
| 1.03 | මානව ධර්ම වැදගත් වන්නේ ඇයි ? | පැය 6 |
| 1.04 | මානව ධර්ම හා මූලික මනුෂ්‍ය අවශ්‍යතා | පැය 6 |
| 1.05 | මනෝ විද්‍යාත්මක හා ආගමික චර්යා ධර්ම | පැය 3 |
| 1.06 | මානව ධර්මයන්හි ආගමික හා දාර්ශනික පදනම | පැය 6 |
| 1.07 | න්‍යායික දැනුම හා ප්‍රායෝගිකත්වය | පැය 6 |
| 1.08 | මානව ධර්ම හා හැ දූ ද රූ අත සූත්‍රය | පැය 3 |
| 1.09 | මානව ධර්ම ප්‍රවර්ධනය දේශීය උරුමය | පැය 6 |

| | | |
|---|---|---|
| (2) | අධ්‍යාපනය ද ආධ්‍යාපනය ද ධ්‍යාපනය ද | පැය 72 යි |
| ★ | අධ්‍යාපන සංකල්ප විග්‍රහය | පැය 6 |
| ★ | දේශීය අධ්‍යාපනය හා රට රටවල අධ්‍යාපන ක්‍රම | පැය 6 |
| ★ | අධ්‍යාපනයේ අරමුණු ජාතික පොදු අරමුණු හා පොදු නිපුණතා | පැය 6 |



ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

★ දේශපාලනඥයකු සඳහා මූලිකවන අධ්‍යාපනය පැය 6

★ දේශපාලනඥයා සතුවිය යුතු ජාතික පොදු අරමුණු
පැය 6

★ දේශපාලනඥයා සහ ජාතික පොදු නිපුණතා පැය 6

★ විධිවත් නොවිධිවත් හා අවිධිවත් අධ්‍යාපනය පැය 6

★ සාම අධ්‍යාපනය හා ගැටුම් නිරාකරණය පැය 6

★ සැමට අධ්‍යාපනය හා ප්‍රජා කේන්ද්‍රීය අධ්‍යාපනය පැය 6

★ විශේෂ අධ්‍යාපනය කාර්මික හා තාක්ෂණික අධ්‍යාපනය
පැය 6

★ ආකල්ප වර්ධනය හා චර්යා හුරුව පැය 6

★ වෘත්තිය තෘප්තිය හා දේශපාලනඥයාගේ භූමිකාව පැය 6

(3)

❖ ආධ්‍යාත්මික සංවර්ධනය යනු කුමක්ද?

❖ ආධ්‍යාත්මික සංවර්ධනයේ අන්තර්ගතය

- උ ස අ සු සූත්‍රය
- ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා යොදා ගන්නා විධි ක්‍රම
- කායික සංවර්ධනය සඳහා යොදා ගනු ලබන විධි ක්‍රම
- මානසික සංවර්ධනය සඳහා යොදා ගන්නා විධි ක්‍රම.
- අන්තර් පුද්ගල සම්බන්ධතා සඳහා යොදා ගන්නා විධි ක්‍රම.
- ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා නිරතුරු ව කටයුතු කිරීම.
- සිත් පහන් කිරීම හා ප්‍රායෝගික අභ්‍යාස

(4) දේශාභිමානය (පැය 24 යි)

- රාජ්‍ය ලාංඡනය සිංහ ධජය හා ජාතික ගීය
- රට, ජාතිය හා ආගම හා සර්ව ශුභවාදී බව
- සර්ව අශුභවාදී දෘෂ්ටිගත වීම
- ජාතිවාදය , ජාතිභේදවාදය හා ජාති භ්‍රෂ්ඨ පැවැතුම්
- පොදු දේපළ ආරක්ෂා කිරීම

❖ දේශයේ යහපත සඳහා ද , සංවර්ධනය සඳහා ද, නිරතුරු ව දායක වීම.

❖ ජාතියට මග පෙන්වීම , පොදු ජීවිතයට මුල් තැන

(5) ජාතිකාභිමානය හා ජාතික සංවර්ධනය (පැය 12 යි)

❖ ශ්‍රී ලංකාව අපේ රට බව තිව්‍රකොට කටයුතු කිරීම

❖ ශ්‍රී ලංකාවේ උරුමයක් හඳුනා ගෙන, ශ්‍රී ලංකාවේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා කටයුතු කිරීම.

❖ දේශයේ ගෞරවය ආරක්ෂා කිරීම, සියලු ජාතීන් එකමුතු ව සාමූහික ව කටයුතු කිරීම.

❖ හැකි උපරිම මට්ටමකින් ප්‍රජා සේවයේ යෙදීම.

❖ සමෘද්ධිමත්, සාමකාමී ශ්‍රී ලංකාවක් ගොඩ නැගීම සඳහා කැපවීම.

ජාතික ගීය, ජාතික පුෂ්පය, ජාතික ලාංඡනය, ජාතික පක්ෂියා, ජාතික ක්‍රීඩාව

❖ පොදු ජන කැපවීම

(6) ස්වාත්මාභිමානය (පැය 36යි)

- තමා කවුදැයි හඳුනා ගනියි. (පුද්ගලයෙකු වශයෙන් හා දේශපාලනඥයකු වශයෙන්)
- හෘද සාක්ෂියට එකඟ ව කටයුතු කිරීම.
- දූෂණයට හා අසාධාරණයට හිස නො නැමීම.
- අධිෂ්ඨානශීලි ව හා අභිමානවත් පෞරුෂයකින් යුක්ත ව කටයුතු කිරීම.
- වෘත්තිය කුමක් වුවත් එය ජාතික මෙහෙවරක් ලෙස සැලකීම.
- වෘත්තිය සදාචාරය සුරකිමින් ,අපේකම, අගය කිරීම.

(7) දේශපාලනඥයා උපදේශකයකු වශයෙන් පැය 36 යි

- නීතිගරුක ව හා යුක්තිගරුක ව කටයුතු කිරීම
- මානව අයිතිවාසිකම් අගයන සමාජයක් ගොඩනැගීම.
- සමාජ සාධාරණත්වය තුළින් සාමය
- උපදේශනය හා කළමනාකරණය

(8) පොදු දේපළ හා පරිසරය සුරැකීම. පැය 36 යි

- පවතින සම්පත්වලින් උපරිම ඵල නෙලා ගැනීම.

සම්පත් හඳුනා ගැනීම හා සංරක්ෂණය

ස්වාභාවික පරිසරය සුරැකීම

❖ වන ජීවීන් , වන සම්පත් සුරැකීම.

(9) දුරාචාර අධෛර්යවත් කිරීම. (පැය 36යි)

❖ සුචරිතය දුශ්චරිතය හා චරිත සංවර්ධනය

❖ දුරාචාර චක්‍රය හා සමාජ අගතිය

❖ දුරාචාර මොනවාදැයි හඳුනා ගැනීම.

❖ සදාචාරය හා පංචශීල ප්‍රතිපත්තිය

❖ දස පනත ෂරී අත හා මනු නීතිය

❖ දුරාචාරය සමාජය තුළ දෝලනය වන ආකාරය හඳුනා ගෙන
ඒවා වළක්වා ගැනීමට ක්‍රියා කිරීම.

10) දේශපාලනය හා සමාජය දර්ශනය පැය 36

දේශපාලනය අර්ථ කථනය පැය 6

සමාජය හා දර්ශනය පැය 6

❖ ප්‍රජාතන්ත්‍රවාදයේ න්‍යායික පදනම (පැය 6)

❖ ඒකාධිපතිවාදය ධනවාදය හා ෆැසිස්ට් වාදය (පැය 6 )

❖ සමාජවාදය හා කොමියුනිස්ට් වාදය (පැය 6)

❖ න්‍යායික ප්‍රජාතන්ත්‍රවාදය හා ප්‍රායෝගිකත්වය (පැය 6)

11 ප්‍රජාතන්ත්‍ර වාදයෙන් මානව තන්ත්‍ර වාදයට (පැය 18 )

ප්‍රජාතන්ත්‍ර වාදය හා පොදු ජන මතය පැය 6

මානව තන්ත්‍ර වාදය නව සංකල්පයක් පැය 6 යි

ප්‍රජාතන්ත්‍රවාදය හා මානව දයාව (පැය 6)

(12) ස්වශක්තින් අවබෝධ කර ගැනීම (පැය18)

ස්වයං කළමනාකරණය (පැය 6යි)

කාල කළමනාකරණ හා සම්පත් කළමනාකරණය (පැය 6 )

5 එස් සංකල්පය (පැය 6 )

(13) ආපදා කළමනාකරණය (පැය 16)

(14) දේශපාලන නායකත්වය හා ජාතික නායකත්වය
(පැය 6යි)

(15) දේශපාලනඥයාගේ ජීවන දැක්ම (පැය 6යි)

(16) දේශපාලන කළමනාකරණය හා ප්‍රමාද දෝෂ
(පැය 6යි)

(17) දේශපාලනඥයාගේ අනාගත දැක්ම (පැය 6යි)

(18) දේශපාලනඥයාගේ පෞද්ගලික ජීවිතය (පැය 6යි)

(19) සාමය හා ගැටුම් නිවාරණය / නිරාකරණය
(පැය 6යි)

(20) මූලික මනුෂ්‍ය අවශ්‍යතා සපුරා ගැනීම (පැය 6 යි)

(21) ව්‍යාපෘති සැකසීම හා ව්‍යාපෘති මෙහෙයවීම (පැය 18 යි)

(22) සන්නිවේදනය හා උපාය මාර්ග (පැය 6 යි)

(23) මානව අයිතිවාසිකම් හා යුතුකම් (පැය 12 යි)

(24) සමවත් සුවය (පැය 6 යි)

(25) ළමා හා කාන්තා අයිතිය හා යුතුකම් පෙළ ගැස්ම
(පැය 24යි)
ළමා ප්‍රඥාප්තිය කාන්තා ප්‍රඥාප්තිය හා මානව
අයිතිවාසිකම්(පැය 12 )

වැඩිහිටි කාර්ය භාරය (පැය 6 )

ක්‍රියාත්මකවන ස්වරූපය පැය 6

(26) අසරණ සරණ (පැය 12යි)

(27) දේශපාලන කිරුළ පැළඳ සාම සිහසුනට ( පැය 6 )

(28) මහින්ද චින්තනයේ අනතර්ගතය 1 සහ 2 ( පැය 36 )

මානව හිතවාදී ආකල්ප

සමාජවාදී හා කොමියුනිස්ට් වාදී ආකල්ප

නව චින්තන අදහස්

ඒවාහි අනගර්ගත මානව ගුණධර්ම

විවිධ දේශපාලන පක්ෂවල චින්තන ධාරා

(29) ජාත්‍යන්තර මෙහෙවර පැය 18 )

තානාපති සේවය

විදේශ කටයුතු

සංචාරක කටයුතු

(30) **සතතාර්ථ සාම ප්‍රවර්ධන සමාජයේ චින්තනය** ( පැය 12)

සත්‍ය

අර්ථ

සාම

දැක්ම හා දර්ශනය

(31) **සංස්කෘතිය හා සභ්‍යත්වය** පැය24)

සංස්කෘතිය හා දේශීය ශ්‍රද්ධානය බලගැන්වීම

සංස්කෘතිය හා ජනමාධ්‍ය ය

සංස්කෘතිය හා රසාස්වාදනය

ආගම් හා ජාතීන් සමග බැඳුණු සංස්කෘති

මානව සංස්කෘතිය හා ගෝක සංස්කෘතිය

(32) **ධාන්‍යාගාර ධාන්‍ය භූමි** ( පැය 42)

පරිසර සංරක්ෂණය

පරිසර දූෂණය

ස්ටොක්හෝම් පරිසර ප්‍රඥාප්තිය

අප යන මග

ධාන්‍යාගාර ධාන්‍යභූමි සංකල්පය

33) **ආගම ධර්මය හා දේශපාලනය** ( පැය24)

ආගමෙන් තොර දේශපාලනය

සර්වාගමික ප්‍රතිපත්ති

ආගම්වල අන්තර්ගත මානව ගුණ ධර්ම

දේශපාලකයාගේ ආගම

34) දේශීය ඥානය බලගැන්වීම (පැය 18)

ජ්‍යොතිෂය හා ගුප්ත ශාස්ත්‍ර

දේශීය තාක්ෂණය

දේශීය සම්පත්

35) විද්‍යාත්මක ඥානය හා පර්යේෂණ පැය 30)

නිරීක්ෂණ

පරීක්ෂණ

පර්යේෂණ විධික්‍රම

පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා කාලය පසුව ගණනය කරනු ලැබේ.

36) පාර්ලිමේන්තු කාර්ය භාරය

37) පළාත් සභා ප්‍රාදේශීය සභා

38) රාජ්‍ය ආයතන පෞද්ගලික ආයතන හා ස්වේච්ඡා ආයතන

39) නායකත්වය හා නායකත්ව භූමිකා

40) ජන වරම් ලැබීම හා ජනහිතවාදී බව

41) සිවිල් නීතිය අපරාධ නීතිය

42) සන්නිවේදන විධික්‍රම

43) කළමනාකරණය

44) ව්‍යපෘති සැකසීම හා නිරීක්ෂණය

45) ආගමික කටයුතු හා පූජ්‍ය පූජක පක්ෂය හා පවත්වන සබඳතා

46) කායික හා මානසික සෞඛ්‍ය විධික්‍රම

47) විශ්‍රාම ගැනීම ව්‍යපත් බව හා ජීවන ගමන

48) භාෂා ඥානය ප්‍රගුණ කිරීම

49) පවුල් සංස්ථාව තුළ කටයුතු කිරීම

50) විදේශ සබඳතා

**මෙම පාඨමාලා වැඩිදුරටත් සංශෝධනය කෙරේ**

මෙහි අන්තර්ගතකර ඇත්තේ දල වශයෙන් පැය 900 පාඨමාලාවකි. දිනකට පැය 6 බැගින් දින 150.

ආධුනික දේශපාලනඥයින්ට අනිවාර්යයෙන් මෙම පාඨමාලාව හැදෑරීමට සැලැස්වීමත් දැනට දේශපාලනයේ නියුතු ආධුනිකයින් සඳහා සුදුසු පරිදි කාලය සකස් කරගැනීමත් සුදුසු ය.

මෙම පාඨමාලාව වැඩි දුරටත් වැඩි දියුණු කිරීමට නියමිත ය.

දේශපාලනඥයින් සඳහා ඇකඩමියක් පිහිටුවන්නට ද

සලකා බලන්න.

පහත සඳහන් පාඨමාලාව ද සලකා බලන්න

## මානව ධර්ම ප්‍රවර්ධනය හා
## අධ්‍යාත්මික සංවර්ධනය සඳහා අධ්‍යාපනය

1 හැඳින්වීම

මානව ගුණ ධර්මවලින් පිරිහීමට පත් රටක සංවර්ධනය සුරක්ෂිත ව පවත්වා ගෙන යන්නට නොපුළුවන.රටක සංවර්ධනය යනු එරටෙහි මානව සහ භෞතික අංශ දෙකෙහි ම සමස්ථ යහපත් සංවර්ධනයයි. එහෙත් වත්මන් ලෝකයේ සංවර්ධනයේ නිර්ණායකය ලෙස බොහෝ අවස්ථාවල සැළකිල්ලට ගනු ලබන්නේ රටෙහි භෞතික සංවර්ධනයයි.

මෙහි දී රටෙහි ආර්ථික සංවර්ධනය හා නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ ව අවධානය යොමු කරනු ලැබේ. මෙහිදී ඒක පුද්ගල ආදායම අනුව ආර්ථික සංවර්ධනය නිර්ණය කිරීම සරල ක්‍රමය වේ. මෙහි දී මූලික වශයෙන් රටේ සමස්ථ දළ දේශීය නිෂ්පාදනය / ආර්ථිකය සහ ජනගහනය පදනම් කරගත් දත්ත උපයෝගී කර ගැනේ.

2 අවශ්‍යතාව

එහෙත් මානව චර්යාව/ සාරධර්ම / මානව ගරුත්වය පිළිබඳව සමාජය තුළ ඇති සැලකිල්ල ආදී කිසි දෙයක් පිළිබඳ ව නිසි ලෙස අවධානයක් යොමු කරන බවක් පෙනෙන්නට නැත.

එසේ ම මෙම තත්ත්වය හේතුවෙන් සමස්ථ සමාජයට කිසියම් ආකාරයක දෙදරීමකට පත් වී ඇති බව පෙනේ.

සාක්ෂරතාවය අතින් ආසියානු කලාපය තුළ ශ්‍රී ලංකික ජන සමාජය ඉතා ඉහළ ස්ථානයක් හිමිකර ගනී. එසේ ම සමාජ විරෝධී ක්‍රියාවලින් ද ශ්‍රී ලංකාවට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි.

මෙම තත්ත්වයට මුලික හේතුව මානව ධර්ම පිළිබඳව සමාජය තුළ ඇති සැළකිල්ල දිනෙන් දිනම අඩුවීමයි.

මේ පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී පුද්ගලයා පවුල සමාජය යන ආයතන තුන අතර පවතින අයහපත් සම්බන්ධතාවය මීට ප්‍රධාන හේතුවක් වී ඇති බව දැක්විය හැකිය.

පුද්ගලයා පවුල සමාජය යන තේමා තුන අතර ඇත්තේ නිරන්තරයෙන් පවතින අන්තර් ක්‍රියාවලියකි.

මෙම අන්තර් ක්‍රියාවලියේ දී අවශ්‍යතා සපුරා ගන්නා විට බොහෝ විට අසමතුළිත තත්ත්වයක් හටගනී.

මෙසේ හටගන්නා අසමතුළිත තත්ත්වය හේතුවෙන් බොහෝ අවස්ථාවල ඇති වන්නේ ගැටුම්කාරී තත්ත්වයන් ය.

මෙහි ප්‍රතිඵලය වන්නේ මානව ගරුත්වය පිරිහී යාමයි.

මෙම ක්‍රියාවලියේ දී වඩාත් වැදගත් වන්නේ පුද්ගලයාගේ ස්වාධීන ක්‍රියාවලියයි.
කිසියම් පුද්ගලයකු ක්‍රියා කරන්නේ ඔහුට ම විශේෂිත වු ප්‍රතිපත්තියක පිහිටා ය.

එම ප්‍රතිපත්තිය ගොඩ නැගෙන්නේ,
ඔහු නිරන්තරයෙන් ලබන අත්දැකීම්,
මුහුණදෙන අවස්ථා ඔස්සේ ඇති කරගනු ලබන ආකල්ප,
ඇගයීම් සහ
ඒ මත ඇති කරනු ලබන තීරණ හා ප්‍රතිපත්ති මතය.

සරල ව එය මෙසේ දැක්විය හැකිය

පාසල, පවුල, සමාජය, පරිසරය, අධ්‍යාපනය, ආගම, ආධ්‍යාත්මික සංවර්ධනය,ආර්ථික සංවර්ධනය,මානව ගුණ ධර්ම ප්‍රවර්ධනය,
හා සාමය.

තමා බාලකාලයේ සිට ම නිරන්තරයෙන් ලබන අත්දැකීම් ඔස්සේ පුද්ගලයා සිය චර්යාවන් ගොඩනගා ගනී.

මෙහි දී සමහර විට පොදු සාරධර්ම / ආචාර ධර්ම කුමක් වුව ද සමහර පුද්ගලයන් තමාගේ සිතැගි පරිදි ඕනෑ ම ක්‍රියාවක් කිරීමට පසුබට නොවේ.

මෙහි ප්‍රතිඵලය වන්නේ පුද්ගලාන්තර සම්බන්ධතාවන්හි අසමතුලිත තත්ත්වයක් ඇතිවීමත් ඒ තුළින් සමාජ හර පද්ධතිය බිඳීයාමත් ය.

මෙම ක්‍රියාවලියේ අවසානය මානව ගරුත්වය / සාරධර්ම / ආචාරධර්ම ආදි යහපත් සමාජ සංසිද්ධීන් පිළිබඳ ව නොසළකා හැර තමාගේ සිතැගි පරිදි පමණක් කටයුතු කිරීමට මිනිසා පියවර ගැනීමයි.

මෙම අහිතකර තත්ත්වයට කිසියම් හෝ ආකාරයකින් ප්‍රතිකාරාත්මක ක්‍රියාමාර්ග ගැනීම කාලීන අවශ්‍යතාවක් බව ඉතාමත් පැහැදිලිය මානව ධර්ම ප්‍රවර්ධනය හා අධ්‍යාත්මික සංවර්ධනය එම අවශ්‍යතාවය අරමුණු කර ගත් වැඩ සටහනකි.

1) පෙර විමසුම

2) පොදු අරමුණ

මානව ගරුත්වයකින් යුතු ගුණ ධර්ම රකින යහපත් සමාජයක් ගොඩනැගීම.

3 සුවිශේෂ අරමුණු

3. 01 මානව ගරුත්වයකින් යුතුව කටයුතු කිරීම පිළිබඳ ව ජනතාවට අවබෝධයක් ලබාදීම.

3. 02 මානව ගුණධර්ම සුරකින සමාජයක් ගොඩනැගීම..

3.03 යහපත් පවුල් පරිසරයක් ගොඩනැගීම.

3. 04 සියලු ජාතීන් අතර සුහදතාවය වර්ධනය කිරීම.

3. 05 ජාතික අවශ්‍යතාවය අනුව මානව සහ භෞතික සම්පත් ඵලදායි ලෙස යොදවා ගැනීම.

4) කාර්ය අරමුණු

පොදු අරමුණු සහ සුවිශේෂ අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ම විශේෂයෙන් සැළසුම් කරනු ලබන ක්‍රියාකාරී සැළැස්මක් විය යුතුය.

මෙම ක්‍රියාකාරී සැළැස්ම අංශ තුනකින් යුතුව ක්‍රියාත්මක කෙරේ.

4. 01 ප්‍රතිකාරාත්මක - පවතින අහිතකර තත්ත්වයන්ට පිළියම් ලෙස පාදක වු වැඩ සටහන්

4.02 නිවාරණාත්මක - සමාජයීය අසමතුළිත තත්ත්වයට පාදක වු සහ එසේ පාදක වන හේතු වළක්වන වැඩ සටහන්.

4.03 සංවර්ධනාත්මක - ගොඩනගන්නාවු / නිර්මාණාය කරන්නාවු නව යහපත් සමාජය, ඒ ආකාරයෙන් ම හෝ ඊට වඩා ගුණාත්මක තත්ත්වයන් දක්වා වර්ධනය කරවීමට අවශ්‍ය දැනුම ලබාදීමට වැඩ සටහන් සකස්

සටහන්

5.01 අවබෝධාත්මක / දැනුවත් කිරීමේ වැඩ සටහන් රාජ්‍ය සහ රාජ්‍ය නොවන අංශවල සියළු ම ශ්‍රේණිවල සේවා නියුක්තිකයන් දැනුවත් කිරීම සඳහා වැඩ සටහන් මේ සඳහා විවිධ ක්ෂේත්‍රවල විශේෂඥ දැනුමක් ලබා ඇති විද්වත් මණ්ඩලයක සේවය ලබා ගැනීමට අපේක්ෂිත ය.

5 02 පාසල් පද්ධතිය තුළ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා
6 දැනුවත් කිරීමේ වැඩ සටහන් .

5. 03 ප්‍රාදේශීය වශයෙන් ග්‍රාම සංවර්ධන මරණාධාර සමිති වැනි සංවිධාන තුළින් ප්‍රජා අවබෝධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

මෙම සියලු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේ දී ජන සහභාගිත්වය උපරිම අන්දමින් ලබා ගැනීමට අපේක්ෂිතය.

7 .නිවාරණාත්මක සංවර්ධනාත්මක වැඩ සටහන් පාසල් පද්ධතිය තුළ සිසුන්ගේ දැනුම වර්ධනය උදෙසා තරග පැවැත්වීම චිත්‍ර / පෝස්ටර් / ඡායාරූප ප්‍රදර්ශණය වෙනත් ශ්‍රව්‍ය / දෘෂ්‍ය මාධ්‍යන් තුළින් ප්‍රජා අවබෝධය සහ ප්‍රජා සහභාගිත්වය ලබා ගැනීම.

සැළසුම් කරනු ලබන සියළු ම වැඩ සටහන් පුද්ගලයා, පවුල, ප්‍රජාව, කේන්ද්‍ර කොට ගෙන ක්‍රියාත්මක කළ යුතුව ඇත.

පුද්ගල කේන්ද්‍රිය වැඩ සටහන් තුළින් සෑම පුද්ගලයකු ම ස්වාර්ථයෙන් ම පරාර්ථය ද මුල් කර ගෙන කටයුතු කිරීමේ චර්යාවන්ගෙන් යුතුව කටයුතු කරන්නෙකු බවට පත්කිරීමේ වැඩ සටහන් දියත් කිරීමට සැළසුම් කෙරේ.

6.01 අයිතිවාසිකම් මෙන් ම යුතුකම් සහ වගකීම් ද ඉටු කිරීම අගය කොට සළකන පුද්ගලයන් ඇති කිරීම.

6.02 මානව දයාව හා හෘද සාක්ෂියට එකග ව කටයුතු කිරීම කෙරෙහි පුද්ගලයන් යොමු කිරීම .

6.03 ළමා අයිතිවාසිකම් මෙන් ම ළමයින්ගේ ළමා කාලය ද අගය කරමින් ආරක්ෂා කිරීම ළමා කාලය අනාගතය හැඩ ගන්වන වැදගත් ම යුගය වන හෙයින් සදාචාරාත්මක බුද්ධිමය සහ චිත්තවේගීය වශයෙන් ළමා සංවර්ධනය උදෙසා කටයුතු යෙදීම.

6.04 සෑම පුද්ගලයකුට ම ස්ව අවබෝධය ( තමා පිළිබඳව තමාගේ හැගීම් හැසිරීම් අභිලාශයන් චර්යාවන් ) ලබා ගැනීම උදෙසා ද ළමා අධ්‍යාපන වැඩ සටහන් සැළසුම් කර ක්‍රියාත්මක කිරීම.

දෙමාපිය දූ දරු ගුරු සිසු සේවක ස්වාමි අඹුසැමි ආදි

සමාජයීය සම්බන්ධතාවන්හි ගිලිහී ගොස් ඇති ගුණ ධර්ම නැවත ඇති කිරීමට වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතුව ඇත.

මානව අවශ්‍යතාවන්ට ගැලපෙන ආධ්‍යාත්මික සංවර්ධනයට

රුකුල් දෙන සංවර්ධනාත්මක දර්ශනයක් මත පදනම් වූ ජාතික ප්‍රතිපත්තියක් සඳහා වන ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් ඇති කිරීම.

8 මෙහි දී ජාතිවාදී ආගම්වාදී දේශපාලනික ආදී වශයෙන් වන නිරන්තරයෙන් ඇතිවන ජාතික මට්ටමේ ගැටළු පාසල් පද්ධතියට කාන්දුවීම වළක්වා ගත යුතු ව ඇත.

9 න්‍යායාත්මක අධ්‍යාපන ක්‍රමය මෙන් ම ජීවන කුෂලතාවලට මුල් තැනක් දෙන අධ්‍යාපන ක්‍රමයක් සැළසුම් කර ක්‍රියාත්මක කිරීම.

10 සමාජයේ පැවැත්ම නිරූපණය වන්නේ මිනිසාගේ ක්‍රියාකාරකම් මත වන හෙයින් මිනිසාගේ ක්‍රියාකාරිත්වය හැසිරීම පිළිබඳ ව පර්යේෂණාත්මක අධ්‍යයන ආයතනයක් ආරම්භ කිරීම.

11 මේ තුළින් මානව වර්ධනය හා චර්යාව පිළිබඳ ව අවබෝධයක් ඇති කළ හැකිය.

12 සාමය සහජීවනය සමානාත්මතාවය අගයන සමාජයක් ගොඩ නැගීම සඳහා වැඩ සටහන් දියත් කිරීම.

13 සාරධර්ම සුරකින වගකීම් ඉටු කරන යහපත් පවුල් ඒකක ගොඩ නැගීමට වැඩ සටහන.

14 සමාජයේ සෑම ක්ෂේත්‍රයක ම පැතිර යමින් පවතින
කායික මානසික හා වාචික වද හිංසා වැළැක්වීමට
වැඩ සටහන්.

15 පුද්ගලයාගේ ආධ්‍යාත්මික ගුණාවගාව වැඩි දියුණු කිරීම උදෙසා විශේෂිත වූ වැඩ සටහන් දියත් කිරීම අවශ්‍යවන්නකි.

16 ජන සංනිවේදන මාධ්‍ය විවිධ පැතිකඩ ඔස්සේ
විවිධාකාර වූ අන්දමින් සමාජය කෙරෙහි බලපෑම්
ඇති කරයි.

17 මෙහි දී සමාජයේ යහපැවැත්ම කෙරෙහි ජන
සංනිවේදනයේ බලපෑම තව තවත් අර්ථවත් කරවීම
මෙන්ම අයහපත් පැවැත්ම කෙරෙහි ඇති කරන
බලපෑම අවම කිරීමට කටයුතු කළයුතු වේ.

18 සිවිල් සමාජය තුළ සීඝ්‍රයෙන් පැතිරයන අවිභාවිතය

19 තුරන් කිරීමට හෝ හැකි උපරිම අන්දමින් අවම කිරීමට
කටයුතු කිරීම කළ යුතුය.

20 සෑම පුද්ගලයකු තුළම පුද්ගල මානසික ආර්ථික කළමනාකරණය පිළිබඳ අවබෝධයක් ඇති කිරීම.

21 පුද්ගලයා තුළ ඇති නිර්මාණශීලිත්වය උපරිම අන්දමින් පෝෂණය කිරීම තුළින් ඔහු සමාජයට අත්‍යවශ්‍ය පුද්ගලයකු බවට පත් කිරීමට කටයුතු කිරීම.

22 දේශීය සංස්කෘතිය සභ්‍යත්වය ආරක්ෂා කිරීම.

23 විවාහය, විවාහ ජීවිතය, අඹුසැමි දෙමාපිය යුතුකම්, වගකීම්, පිළිබඳ ව අවබෝධාත්මක වැඩ සටහන් ( පූර්ව විවාහ උපදේශක සහ විවාහ උපදේශනය ).

24 පුද්ගලාන්තර සබඳතා වඩාත් යහපත් ලෙෂ තහවුරු කිරීම.

25 ජාති ආගම් කුල වර්ණ ආදී වශයෙන් බෙදී ඇති මානව වර්ගයා එම විවිධ බේද ඇති කරවන තත්ත්වයන් වළක්වා එකම මිනිස් සමාජයක් වශයෙන් එක්සත්ව එක්සිත් කටයුතු කිරීමට යොමු කිරීම.

26 ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම.ජාතික සංවර්ධනයට බාධාකාරීවන දූෂණය නාස්තිය හා අක්‍රමිකතා නැති කිරීමට කටයුතු කිරීම.

27 ශ්‍රම නාස්තිය කාලය නාස්තිය මුදල් පරිභෝජනය ද්‍රව්‍ය නාස්තිය භෞතික සම්පත් නාස්තිය වැළැක්වීම.

28 ඉහත වැඩ සටහන් ආයතන මට්ටමෙන් ප්‍රාදේශීය මට්ටමෙන් හා ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක කළ යුතුව ඇත.

සියළු ම වැඩ සටහන් සත්‍යාර්ථ සාම ප්‍රවර්ධන සමාජයේ හා එම සංවිධානය විසින් තෝරා ගනු ලබන විශේෂඥ, දැනුමක් ඇති සම්පත් දායකයින් විසින් ක්‍රියාත්මක රන්නට අපේක්ෂිත ය.

සතතර්ථ සාම ප්‍රවර්ධන සමාජයට සුදුසු විද්වතුන් තෝරාගෙන අදාළ පුහුණුවීම් වැඩමුළු හා දේශන පැවැත්වීමට පිළිවන.

උපාධිධාරීන් සඳහා පූජ්‍ය පක්ෂය සඳහා ගුරුවරුන් පරිපාලකයින් යනා දී විවිධ තරාතිරම්වලට අයත් අය සඳහා තව ද පාඨමාලා සකසා ඇත.

ඉතිරි ව ඇති සියල්ල ඔබ තුමා හෝ රැගෙන එවායින් කිසියම් ප්‍රයෝජනයක් ලබාගත හැකි යැයි සිතන්නේ නම් ලබා ගන්න.

සුදුසු යැයි සිතන්නේ නම් පමණක් මාගේ මෙහෙවර කරන්නට මටත් ඉඩක් ලබා දෙන්න.

මාගේ ද සත්‍යාර්ථ සාම ප්‍රවර්ධන සමාජයේ ද නිරහංකාර ඉල්ලීම මෙයයි .

සතතාර්ථ සාම ප්‍රවර්ධන සමාජය විසින් කරනු ලබන

යහපත් මෙහෙවර තුළින්සකල ලෝක සත්ත්වයාට ම

සැනසීමට පත් විය හැකි වේවා.සකල ලෝක සත්ත්වයා ම

සුබී සුවපත් භාවයටපත් කරන්නට අවශ්‍ය

යහපත් මෙහෙවරක යෙදෙන්නට

මට හැකිවේවා.

සකල ලෝක සත්ත්වයා ම

සුබී සුවපත් භාවයට පත්වේවා !

සතතාර්ථ සාම ප්‍රවර්ධන සමාජයේ පරම අධිෂ්ඨානය
ඔබතුමා ප්‍රමුඛ සියලු මැති ඇමතිවරුනගේ
පරම අධිෂ්ඨානය වේවා!

ඔබතුමාට එවූ ලිපියක් පහත පළ කරමි

මේ සමග ඉදිරිපත් කරන කරුණු අවධානයට ගෙන ඔබ තුමාගේ මහින්ද චින්තනය වඩාත් ඵලදායී ලෙය ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ගන්නා ලෙස කාරුණික ව ඉල්ලමි.

මේ මගින් ශ්‍රී ලංකා වාසීන්ටත් පොදුවේ මානව වර්ගයාටත් නව මාර්ගයක් විවෘතකර දෙන්නට අවශ්‍ය පියවර ගන්නා ලෙස කාරුණික ව ඉල්ලමි.

මෙම කරුණු මීට ඉහත විවිධ දේශපාලනඥයින් වෙත ද මා සේවය කළ ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වරුන් වෙත ද වරින්වර ඉදිරිපත් කරනු ලැබුව ද කිසිවකු ඒවා ක්‍රියාත්මක කරන්නට ඍජුව ම ඉදිරිපත් වූයේ නැත.

එහෙත් මහින්ද චින්තනයෙන් එම කරුණු බොහොමයක් අවධානයට ගෙන තිබීම සතුටට කරුණකි.

පසුගිය කාලයේ ජාතික අධ්‍යාපන ආයතනයේ සහකාර අධ්‍යක්ෂ ජනරාල්වරයකු වශයෙන් ද විටින් විට වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් කටයුතු කරද්දී ද ආරම්භ කරන්නට යෝජනා කරන ලද වැඩසටහන් ක්‍රියාත්මක කරන්නට ගන්නා ලද උත්සාහයන් සියල්ල ව්‍යවර්ත විය.

එසේ වුයේ අවශ්‍ය සහාය අවශ්‍ය අවස්ථාවන් හි දී නොලද හෙයිනි.

එවකට අධ්‍යාපන අමාත්‍යාංශයේ නවෝද්‍යා පාසල් බාරව සිටි, දැන් ජනාධිපති තුමාගේ ලේකම් වශයෙන් කටයුතු කරන ලලිත් වීරතුංග මහතා අධ්‍යාපන අමාත්‍යාංශයේ සිටියදී

මානව ධර්ම ප්‍රවර්ධනය හා ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා ස්වයං කළමනාකරණය හා ස්වයං චර්යා වර්ධන පාඨමාලාවක් හඳුන්වා දෙන්නට යෙදුනි.



ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

මෙය යුගයේ අවශ්‍යතාවක් ලෙස සලකා ක්‍රියාත්මක කරන්නට ක්‍රියා කළ ද එතුමා අධ්‍යාපන අමාත්‍යංශයෙන් බැහැර ව ගිය පසු එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අහෝසි විය.

එහෙත් ජාතික අධ්‍යාපන ආයතනයෙන් විශ්‍රාම ලැබූ පසුව ද විවිධ දුෂ්කරතා මධ්‍යයේ වුව ද පහත සඳහන් වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා තනි ව පියවර ගනු ලැබුවෙමි.

නිලධාරින්ගේ අකටයුතුකම් ද ප්‍රායෝගිකත්වයෙන් බැහැර වූ නව චින්තනයකින් වියුක්තවූ ක්‍රියාකාරකම් නිසා ද රටේ සංවර්ධනයට දායක වන්නට විශ්‍රාම ලබා අඛණ්ඩ මෙහෙයක යෙදෙන අයට ඉමහත් බාධාවක් ව ඇති බව කණගාටුවෙන් සඳහන් කරමි.

ගරු ජනාධිපති තුමනි රටේ ජාතියේ මෙන් ම මානව වර්ගයාගේ යහපත සඳහා **සත්‍යාර්ථ සාම ප්‍රවර්ධන සමාජය** විසින් එළි දක්වන චින්තනයට ද ඉඩක් ලබා දෙන්න.
මහින්ද චින්තනයට **සත්‍යාර්ථ සාම ප්‍රවර්ධන සමාජය** විසින් එළි දක්වන චින්තනය ද මුහුකර ගන්න.
එම චින්තනයෙන් ඔබතුමාගේ චින්තනය මුවහත් කර ගන්න.
මානව වර්ගයාගේ යහපත පතමින්
**මිනිසකු වෙතින් තවත් මිනිසකු** වෙත මානව ගුණධර්ම ගෙනයාම සඳහා අප දරන උත්සාහයට දායක වන්න.

මිනිසුන් තුළ මානව ගුණධර්ම ප්‍රවර්ධනය කිරීමෙන් හා ආධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කිරීමෙන් තොර ව අපේ මාතෘ භූමියේ ජීවත්වන ජනතාවට හෝ මානව වර්ගයාට යහපත් අනාගතයක් උදාකර දීමට නොපුළුවන් බවතරයේ විශ්වාස කරන බව ද සිහිපත් කරමි.

1) අධ්‍යාපනය

1.01 ජාත්‍යන්තර ළමා නිකේතන පර්යේෂණ හා සංවර්ධන පුහුණු ආයතනයක් පිහිටු වීම.

1.02 පෙර පාසල් ගුරුවරුනට විකල්ප වශයෙන් සිහිති උපදේශිකාවන් පුහුණු කිරීමට නව වැඩ පිළිවෙළක් ආරම්භ කිරීම.

1.03 නෙත නොගැටෙන දරුවෝ,නෙත නොගැටෙන පෙර ළමා විය ගුරුමාතා , නෙත නොගැටෙන ගුරුමාතා හා විදුහල්පති වැඩ සටහන.

2. ජාතික වැඩ සටහන්

2 01 නෙත නොගැටෙන හෙළ වීරුවෝ

දේශීය ඥානය පණ පොවන්නට දායක වූ හෙළයින්ගේ චින්තනය ඒකරාශිකර භාවිතයට ගන්නට ගන්නා ලද උත්සාහය කිසිවකුගේ සහායක් නොමැති නිසා ක්‍රියාත්මක නොවී පවතී.

2 02 ධාන්‍යාගාර ධාන්‍ය භූමි වැඩ සටහන.

පාසල් භූමි, ආයතන භූමි, ඇතුලු මාතෘ භූමියේ සෑම බිම් අඟලක් ම සරු කරන්නට හෘදයංගම ව කැපවීමට රුකුල් දෙන ආකල්ප වර්ධනයක් ඇති කොට සෑම පුරවැසියකු ම වැඩ කරන මිනිසකු බවට පත්කරන්නට අරඹන ලද වැඩ පිළිවෙළකි

2 03 විද්‍යාවෙන් විනයට වැඩ සටහන

තමය විද්‍යා ඥානය උපයෝගී කරගෙන විනය ගරුක බව ඇති කිරීමට කරනු ලබන නව ප්‍රවේශයකි.

ශ්‍රී ලංකාව පුරා විසිර පවත්නා සැඟවුණු ඉපැරණි ඥානය හා නවීන විද්‍යාවෙන් එළිදක්වන තාක්ෂණික ඥානය මුහුකොට නව තාක්ෂණ විධි හඳුනා ගෙන ශ්‍රී ලංකා වාසීන්ටත් මානව වර්ගයාටත් වැඩදායක සොයා ගැනීම් කිරීම සඳහා දිරි දීමට සැකසූ වැඩ පිළිවෙළකි.

2 04 මානව ධර්ම ප්‍රවර්ධනය හා ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා ස්වයං කළමනාකරණය හා ස්වයං චර්යා වර්ධන පාඨමාලාව.
දේශපාලනඥයන් ඇතුලු සියලු ම වෘත්තිකයින් ද පොදු මහජනතාව ඇතුලු බාල පරම්පරාව ද පාසල් දරුවන් ද මෙම පාඨමාලාව හදාරන්නේ නම් සාමයේ මාවතට ප්‍රවේශ වන්නට එයින් බලවත් රුකුලක් ලැබෙණු නිරණුමාණ ය.

මෙවැනි පාඨමාලා ඇතුලු වැඩ සටහන් රාශියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ගන්නා ලදී. දැනට විද්‍යා හා තාක්ෂණ කටයුතු අමාත්‍යාංශයේ දායකත්වය ඇති ව විද්‍යාවෙන් විනයට වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු යොදන්නට ප්‍රවේශයක් කිරීම මැනවි.

මා විසින් ආරම්භ කරන්නට යෙදුණු ළමා නිකේතන හා පර්යේෂණ හා සංවර්ධන පුහුණු ආයතනය මගින් පෙර පාසල් ගුරු පුහුණු වැඩ සටහනක් එනම් සිගිති මාතා උපදේශිකා පුහුණු ව ආරම්භ කර පවත්වා ගෙන යනු ලැබේ.

මේ සඳහා පැවැත්වෙන පාඨමාලාවට දකුණු පළාතෙන් පමණක් සිසුන් 400 ක් පමණ සහභාගි විය. එහෙත් ඒ සඳහා නිසි සහයෝගයක් නොලැබීම ගැන කණගාටුවට කරුණකි.
අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ද සංස්කෘතික අමාත්‍යාංශය වෙත ද වැඩ පිළිවෙළවල් දෙකක් ඉදිරිපත් කර තිබේ.

මහ මැතිවරණයට පෙර සිට ම ඔබතුමාට කරුණු දැනුම් දෙනු ලැබුව ද මට පැහැදිළි වූයේ එම කිසිදු තොරතුරක් ඔබතුමාට හොලැබී ඇති බව ය.

එම නිසා අපේ දැක්ම අනුව සකස් කළ රටේ සංවර්ධනයට ඉවහල්වන මානව වර්ගයාගේ යහපතට ඉවහල්වන සත්‍යාර්ථ සාම ප්‍රවර්ධන සමාජයේ වැඩ පිළිවෙළ සාකච්ඡා කිරීම සඳහා අවස්ථාවක් සලසා දෙන ලෙස කාරුණික ව ඉල්ලමි.

අපි මිනිසකු වෙතින් තවත් මිනිසකු වෙත මානව ගුණධර්ම ගෙන යාම සඳහා ද මානව වර්ගයා ඇතුලු සකල ලෝක සත්ත්වයාගේ යහපත හා සැපත සඳහා කටයුතු කරන්නට ද ප්‍රතිඥා දී ඇත්තෙමු.ඒ සඳහා කටයුතු කරන්නට සැදී පැහැදී සිටිමු.

සුහදතාවෙන් බැඳී

ආචාර්ය ධම්මික පියතිස්ස බිබිලේ
නිර්මාතෘ සත්‍යාර්ථ සාම ප්‍රවර්ධන සමාජය

**සත්‍යාර්ථ සාම ප්‍රවර්ධන සමාජය**

**Mobile 0718387090 Email**

සත්‍යාර්ථ සාම ප්‍රවර්ධන **සමාජය හඳුනාගත් දර්ශනයේ තේමාව සත්‍ය අර්ථ සාම යන සංකල්ප තුන මත පදනම් ව ඇත. අප වෙහෙසෙන්නේ සත්‍ය ගරුක වෙමින් සත්‍ය සොයා යන්නටත් අන්‍යයන්ට අප හඳුනාගත් සත්‍ය පෙන්වා දෙන්නටත් ය.**

2600 බුද්ධ ජයන්තිය නිමිති කරගෙන ඔබ තුමා බෞද්ධ ධර්මයෙහි ඇතුළත් සත්‍ය ය ලෝක ජනතාවට හඳුනා ගන්නට ඉඩ සලසමින් බෞද්ධ ප්‍රබෝධය පිණිස කටයුතු කිරීම අතිශයින් කාලෝචිත ය.

අතිශයින් අගය කළ යුතු ය.

එහෙත් බුද්ධ ධර්මය වර්තමානයේ දී භාවිතයට ගනු ලබන්නේ ද බුද්ධ ධර්මය තවමත් ව්‍යවහාරයට ගනු ලබන්නේ ද හුදෙක් ආමිස පූජාවට මුල් තැනක් ලබා දෙමින් සංස්කෘතිකාංග පමණක් අගය කරමින් ය.

බණ දහම් වුව ද දේශනා කරනු ලබන්නේ ද විවිධ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනු ලබන්නේ ද සාම්ප්‍රදායික ක්‍රමයට නිසා බුද්ධ ධර්මයෙන් මානව වර්ගයාට අත්කර ගත හැකි ව ඇති ප්‍රතිඵල අල්ප වී ඇත. සියලූ ආගම් සම්බන්ධයෙන් ද මෙම ප්‍රවේශය අදාළ කිරීම අවශ්‍ය වේ.

1) මේ නිසා වර්තමානයේ පැන නැගී ඇති

පුද්ගලයා හා සම්බන්ධ ගැටළු,

පවුල හා සම්බන්ධ ගැටළු,
දුරාචාර පිටුදැකීම සම්බන්ධ ගැටළු
රටවල් හා ලෝකය පිළිබඳ ගැටළු, හෝ
භික්ෂූන් වහන්සේලා හා සාසනය සම්බන්ධ ගැටළු
විසඳා ගැනීමේ දී තවමත් විශාල පසු බෑමක් ඇති බවට හොඳහොඳ
සාධක දක්නට ඇත.

2) අද බුදු දහම ඇදහිල්ලකට සීමා වෙමින් ඇත් ද යන ප්‍රශ්නය
අප ඉදිරියෙහි ඇත.

3) සංස්කෘතික හර පද්ධතියක් සුරකින ආමිස පූජාව ප්‍රමුඛ කරගෙන කටයුතු කරමින් පවත්නා ආගමකට බුදු දහම සීමා වෙමින් තිබේ ද යන්න ද ප්‍රශ්නයකි.

4) බුදු සසුන බබළවන්නට භික්ෂූන් වහන්සේලා ඇතුලූ බාල,
තරුණ, මහළු, සියලූ බෞද්ධයින් ද
දේශපාලන නායකයින් ද
පරිපාලකයින් හා ප්‍රජා නායකයින් ද
විශේෂයෙන් දේශපාලන නායකයින් ද
සැබෑ බෞද්ධ ප්‍රතිපත්ති හඳුනාගෙන බෞද්ධ ප්‍රතිපත්ති අනුව ජීවත්වන්නවුන් බවට පත්විය යුතුවේ.

5) ඒ සඳහා බෞද්ධ මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනයට ප්‍රමුඛත්වය ලබා දෙමින් නව වැඩ පිළිවෙළක් සකස් කළ යුතුව තිබේ.(දැනටමත් යම්තාක් දුරට සකස්කර ඇත)

6) අවශේෂ ආගම් සියල්ල ද තනි නොකර ඔවුන්ගේ අරමුණු හා ක්‍රියාකාරකම් බෞද්ධ විරෝධී හෝ අවශේෂ ආගම් විරෝධී නොවන ලෙස පවත්වා ගෙන යන්නට මගපෙන්විය යුතුව තිබේ.

7) අවශේෂ ආගම් ඔවුන්ගේ ආගම් තුළ මුල් බැසගත් මානව ගුණ ධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා වන වැඩ පිළිවෙළට මූලිකත්වය දෙමින් ක්‍රියාකාරී වන්නට යොමු කළ යුතුවේ.

8) මේ මගින් පුද්ගලයා තුළ සාමය, පවුලේ සාමය රටේ සාමය රටවල් අතර සාමය සඳහා ද ලෝක සාමය සඳහා ද වැඩ පිළිවෙළ සකසා ගත හැකි ය.

9. බුද්ධ ධර්මය හා බැඳි පවත්නා මතවාද ඉවසීම හා එම මතවාද අතර එකඟතා ඇතිවන ලෙස විනා මතභෙද ඇතිවන ලෙස ක්‍රියා නොකරන්නටත් නිකාය භෙද ධර්මය හා සම්බන්ධ මතභෙද සමථයට පත් කිරීමටත් කටයුතුකර බෞද්ධ ජනතාව එක්සේසත් කිරීම අත්‍යාවශ්‍ය ව තිබේ.

10. පාසල් තුළ මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය හා සම්බන්ධ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම බාල පරපුර විනය ගරුක අනාගත පුරවැසියන් බවට පත් කිරීමට අත්‍යාවශ්‍ය ය.

11. දේශපාලනඥයින් සඳහා මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය හා සම්බන්ධ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම ද අත්‍යාවශ්‍ය වේ.(සකස්කර ඇත )

12. පරිපාලකයින් සඳහා මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය හා සම්බන්ධ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම ද අවශ්‍ය ය.(සකස්කර ඇත )

13. දහම් පාසල් තුළ මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය හා සම්බන්ධ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම ද විෂය මාලා මේ අනුව නැවත සංශෝධනය කිරීම ද කළ යුතු ව තිබේ.(සකස්කර ඇත )

14. සෑම පාසල් හා දහම් පාසල් විෂයයක් තුළින් ම මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය හා සම්බන්ධ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට රුකුල් ලැබෙන ආකාරයට විෂය මාලා සංශෝධනය කිරීම අවශ්‍ය ය.

15. මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය හා සම්බන්ධ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට උචිත ලෙස ගුරු පුහුණුව විධිවත් කිරීම ද අත්‍යාවශ්‍ය ය. (සකස්කර ඇත )

16. සියලු ආරක්ෂක අංශ සඳහා මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය හා සම්බන්ධ මූලික දැනුමක් ලබා දී සුදුසු වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම.(මීට පෙර පුහුණු කටයුතුකර තිබේ).

17. විශ්ව විද්‍යාල තුළ පාසල් තුළ මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය හා සම්බන්ධ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම.

18. විදේශික සංචාරකයින් සඳහා බෞද්ධ මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය හා සම්බන්ධ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම.

19. භික්ෂූන් වහන්සේලාට බෞද්ධ උපදේශනය පිළිබඳ පුහුණුවක් ලබා දී දහම් දෙසීම පිළිබඳ පුහුණුවක් ලබා දෙන වැඩ පිළිවෙළක් සැකසීම.

20. මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා උසස් අධ්‍යාපනය ලබා දීමට දේශීය විදේශීය ශිෂ්‍යයින් සඳහා වෙන්වූ විශ්ව විද්‍යාලයක් ජාත්‍යන්තර සහයෝගය ඇති ව පිහිටුවීමට වැඩ පිළිවෙළ සැකසීම. (විශ්වාන්තර විවේකාශ්‍රමය යටතේ දැනට මේ සම්බන්ධ වැඩ පිළිවෙළ සකසමින් ඇත).

21). පාසල් හා විශ්ව විද්‍යාල පාඨමාලා සංශෝධනයකර මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය හා සම්බන්ධ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම යුහුසුළු ව කළ යුතු ව තිබේ.

22) බුදු දහම හැදෑරීමටත් අවශේෂ ආගම් හා දර්ශනවල ඇතුළත් මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය හා සම්බන්ධ අධ්‍යයනයන් කරන්නටත් විදේශ ශිෂ්‍යයිනට හා විද්වතුනට වැඩි වැඩියෙන් අවකාශ සලසා දීම ද අවශ්‍ය ය.

23) ආගමෙන් තොර මානව ගුණ ධර්ම ද ආගම් හා සම්බන්ධ මානව ගුණ ධර්ම ද මතුකර ගනිමින් අවශේෂ රටවල ද ඒවා ප්‍රචලිත කිරීමට සත්‍යාර්ථ සාම ප්‍රවර්ධන සමාජයට අවකාශ ලබා දෙන්න.

24) තානාපති කාර්යාල හා අනුබද්ධ ව ලෝක සාම වැඩ පිළිවෙළක් දියත් කිරීම සඳහා ක්‍රියා කිරීම ද අවශ්‍ය වේ.

25) දේශීය හා විදේශීය සියලු බෞද්ධ සංවිධානවල එකමුතුවක් ගොඩනැගීම හා මූලස්ථානය ශ්‍රී ලංකාවේ පිහිටුවීමත්"අවශ්‍ය ය.

26) දේශීය දැනුම බල ගැන්වීම සඳහා ව්‍යාපෘති ආරම්භ කිරීමත් අවශ්‍යවී තිබේ.

27) සිංහල විශේෂ කොට පාලි හා සංස්කෘත භාෂා ලෝක ව්‍යාප්ත කිරීම සඳහා පුළුල් වැඩ පිළිවෙළක් ආරම්භ කිරීම ද කාලීන අවශ්‍යතාවකි.

28) ආගමික ගුරුවරුන් පුහුණු කිරීම සඳහා පිහිටුවනු ලබන සමයාන්තර විශ්ව විද්‍යාලය තුළ (විශ්වාන්තර විවේකාශ්‍රමය)ගුරු පුහුණුව සඳහා ගුරු පුහුණු අධ්‍යයන පීඨයක් ඇති කිරීම.

29) විදේශ රටවල මෙම සමයාන්තර විශ්ව විද්‍යාලය හා අනුබද්ධිත විශ්ව විද්‍යාල පිහිටුවීම.

30) විදේශ රටවල බෞද්ධ තොරතුරු හා ශ්‍රී ලාංකික ශ්‍රද්ධානය බල ගැන්වීමේ සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීම.

31) ශ්‍රී ලංකාව තුළ ඉංග්‍රීසි භාෂාව පමණක් ප්‍රචලිත කරන්නට සීමා නොවී රුචිකත්වය හා හැකියාව ඇති ඕනෑම කෙනෙකුට පෙර අපර දිග ඕනෑම භාෂාවක් ඉගෙනීම සඳහා පහසුකම් සලසා දීම.

32) විහාරස්ථාන දේවාල සංවර්ධනය කිරීම සඳහා ද ආදායම් නොමැති විහාරස්ථාන සංවර්ධනය සඳහා ද නව වැඩ පිළිවෙළක් දියත් කිරීම.

33) සෑම ආගමික ස්ථානයක් ම දේශීය විදේශීය වන්දනාකරුවනට විවෘත ස්ථාන බවට පත් කරන අයුරින් පහසුකම් වැඩි දියුණු කිරීමට යාන්ත්‍රණයක් සැකසීම.

34) දුරාචාර අධෛර්යවත් කිරීම සඳහා සියලු ආගමික ස්ථාන කේන්ද්‍රකර ගනිමින් නව වැඩ පිළිවෙළක් දියත් කිරීම.

35) සියලු ම ආගම්වලින් තෝරාගත් පූජ්‍ය පූජක පක්ෂයට උපදේශනය,ගැටුම් නිරාකරණය,ආපදා කළමනාකරණය හා සාම අධ්‍යාපනය පිළිබඳ ව පුළුල් ප්‍රායෝගික දැනුමක් හා පුහුණුවක් ලබාදීම.

35) වැඩිහිටියන් සඳහා දහම් පාසල් පිහිටුවීම, පවත්වාගෙනයාම, හා විෂය මාලාවක් පිළියෙල කිරීම. (අවශ්‍ය කටයුතු සකස් කරමින් ඇත).

36) දේශීය හා විදේශීය දසසිල් මාතාවන් හා මෙහෙණින් වහන්සේලා සඳහා පිරිවෙන් කීපයක් හෝ පිහිටුවීම හුවමාරු වැඩසටහන් ඇති කිරීම.

37) පිරිවෙන් අධ්‍යාපනය සඳහා නව විෂයමාලාවක් පිළියෙලකර දේශීය විදේශීය පිරිවෙන් ගුරුවරුන් සඳහා ගුරු පුහුණුව ලබා දීම.

38) විදේශ රටවල පිරිවෙන් පිහිටුවා පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය විදේශයන්හි ප්‍රචලිත කිරීම.

39) පොලිසිය පන්සල හා පාසල අතර සම්පස්ථ බව වැඩි දියුණුකර මෙම ආයතන තුන කේන්ද්‍රකර ගනිමින් මානව ධර්ම ප්‍රවර්ධන හා ආධ්‍යාත්මික සංවර්ධනය සඳහාවන වැඩ සටහන් දියත් කිරීම.

40) දේශීය හා විදේශීය භික්ෂූන් හා භික්ෂුණීන් වහන්සේලා හුවමාරුකර ගැනීමේ වැඩසටහන් ආරම්භ කිරීම.

41) ධනවත් ව්‍යාපාරිකයින් හා විදේශ පරිත්‍යාගශීලී ධනවතුන් හා බෞද්ධ සංවිධාන ඒකරාශි කොට දුප්පත් අසරණ බෞද්ධයින් නගා සිටුවීමේ වැඩ සටහන් ආරම්භ කිරීම.

42) සියලු ම බෞද්ධ සමිති සමාගම් ඒකරාශිකර සම්මේලනයක් හා වැඩමුළුවක් පවත්වා, කළයුතු වැදගත් කාර්යයන් හඳුනා ගෙන ප්‍රමුඛතා ලැයිස්තු සකසා තම තමන්ගේ හැකියාව හා රුචිකත්වය අනුව කාර්යයන් වෙන වෙන ම පවරා ගෙන මාසික හා වාර්ෂික වැඩ පිළිවෙළක් සැකසීම.

43) කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන වශයෙන් මානව ගුණධර්ම සංවර්ධනය හා ආධ්‍යාත්මික සංවර්ධනය ප්‍රමුඛ කරගත් වැඩ පිළිවෙළ හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම.

44) සිරගත වුවන් සිර ගෙයින් නිදහස් ව ගම්බිම් බලා යන්නට පෙර ආගමික ස්ථාන ආශ්‍රය කරගෙන දහම් අධ්‍යාපනය ලැබීම වැඩිහිටි දහම් පාසල්වල ඉගෙනීම ආගමික ස්ථාන වෙත පැමිණ උපදෙස් ලබා ගැනීම අනිවාර්ය කිරීම.

45) සියලු ම ආගම් මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය සම්බන්ධයෙන් ප්‍රමුඛත්වය ගෙන ක්‍රියා කිරීමට පෙළගැස්වීම හා පුහුණුව ලබාදීම.

46) බෞද්ධ ශාසන කොමිශන් සභා පනත සංඝාධිකරණ පනත නැවත සලකා බැලීම හා නව බෞද්ධ ජන සංරක්ෂක වැඩ පිළිවෙළක් සැකසීම.

47) බෞද්ධයන් සඳහා බෞද්ධ නීති ක්‍රමයක් සැකසීම.

48) රාජ්‍යපාලකයිනට අවවාදානුශාසනා කිරීම සඳහා ත්‍රෛ නිකායික මහා නාහිමිවරුන්ගේ නායකත්වයෙන් රාජ්‍ය අවවාදානුශාසනා මණ්ඩලයක් පිහිටුවීම.

49) මහානාහිමිවරුන්ගේ ප්‍රධානත්වයෙන් බෞද්ධ භික්ෂුන් වහන්සේලා සඳහා විනය පාලක මණ්ඩලයක් පිහිටුවීම.

50) වාර්ෂික ව ත්‍රෛනිකායික භික්ෂුන් වහන්සේලා සඳහා පළාත් මට්ටමින් හා ජාතික මට්ටමින් සංගායනා සම්මන්ත්‍රණ පැවැත්වීම.

51) දළදා මාළිගාවේ දියවඩන නිළමේ තුමා ද ත්‍රෛ නිකායික භික්ෂුන් වහන්සේලා ද ප්‍රමුඛ කරගෙන ජාතික මට්ටමේ විද්වත් බෞද්ධ මණ්ඩලයක් පිහිටුවීම.

52) අංක 52 හා අදාළ ව සර්ව ආගම්වලින් සැකසුන ජාතික මණ්ඩලයක් පිහිටුවීම.

53) සිංහල, පාලි,සංස්කෘත, භාෂා මළ භාෂාවන් බවට පත්වන්නට ඉඩ නොදී ජාත්‍යන්තරයට ගෙන යාමේ වැඩ පිළිවෙළක් දියත් කිරීම.

54) ජාත්‍යන්තර බෞද්ධ සංස්කෘතික පර්යේෂණ ආයතනයක් පිහිටුවීම හා මානව ගුණධර්ම හා ආධ්‍යාත්මික සංවර්ධනය සම්බන්ධ පර්යේෂණ සඳහා ප්‍රමුඛත්වය දීම.

55) තානාපති කාර්යාල ආශ්‍රය කරගෙන ජාතික හර පද්ධතීන් ජාත්‍යන්තරයට ගෙනයාමේ වැඩ පිළිවෙළක් ආරම්භ කිරීම.

56) සියලු විහාර දේවාලගම්වල ආදායම් ඒකරාශිකර අරමුදල් පරිහරණය විධිවත් කිරීම.

57) අවශේෂ එක් එක් ආගම් සම්බන්ධයෙන් ද ජාතික අරමුදල් පිහිටුවා අධීක්ෂණය කිරීම.

58) දුප්පත් හෝ අසරණ බවට පත් බෞද්ධයින් සඳහා ජාතික හා ජාත්‍යන්තර සරණාගත අරමුදලක් වෙනම පිහිටුවීම.

59) වැසීයන විහාරස්ථාන ආදායම් රහිත විහාරස්ථාන හා අවශේෂ ඇති හැකි විහාරස්ථාන අතර සබඳතා තරකොට සාසනාරක්ෂක බලමණ්ඩල බල ගන්වා ඒවා තුළින් සංවර්ධන වැඩ සටහන් ආරම්භ කිරීම.

60) විදේශ රටවල විහාරස්ථාන සමග දේශීය විහාරස්ථාන යා කිරීමේ වැඩ සටහනක් දියත් කිරීම.

61) පොහෝ දිනවල හා අවශේෂ තෝරාගත් දිනවල ක්‍රියාත්මක කිරීම සඳහා විහාරස්ථානවල විධිවත් වැඩ සටහන් ක්‍රියාත්මක කරන්නට වැඩ පිළිවෙළක් හඳුන්වා දීම.

62) තෝරාගත් විශේෂ දිනවල හා පොහෝ දිනවල විදේශ විහාරස්ථානවල ශ්‍රී ලංකාවේ වැඩ සටහන්වලට සමගාමී ව ප්‍රායෝගික වශයෙන් වැඩදායකවන වැඩ සටහන් ක්‍රියාත්මක කරන්නට වැඩ පිළිවෙළක් හඳුන්වා දීම.

63) විදේශ විශ්ව විද්‍යාලවල සිංහල, පාලි ,සංස්කෘත මෙන්ම දේශීය ශ්‍රද්ධානය ,බලගැන්වීමේ සංස්කෘතික කේන්ද්‍ර හෝ අංශ පිහිටුවීමට කටයුතු කිරීම.

64) මෙම සියලු කාර්යයන් සඳහා පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩ පිළිවෙළක් අප්‍රමාද ව ආරම්භ කිරීම.

65) මෙම කරුණු පිළිබඳ ව ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන අතර අතිගරු ජනාධිපති තුමා ද දැනුවත්කර ඔබ තුමාගේ නායකත්වයෙන් මෙම වැඩ පිළිවෙළ දියත් කිරීම යෝග්‍ය ය.

ආචාර්ය ධම්මික පියතිස්ස බිබිලේ
හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ජාතික අධ්‍යාපන ආයතනය

ජනාධිපති කාර්යාල
පුස්තකාලය

# චින්තන දෙකක් සහ පාලනයකට කරුණු සියයක්

මානව ගුණයෙන් සපිරුණු

ආධ්‍යාත්මික ශක්තියෙන්

ප්‍රබුද්ධ මානව පරපුරක්

රටටත් ජාතියටත් ලෝකයටත්

මානව සංහතියටත් මිහිතලයටත්

උරුමකර දෙන්නට සුදුසු ලෙස

දේශපාලන ගමන් මග

වෙනස් කරමු


ධර්ම කීර්ති ශ්‍රී දේශමාන්‍ය

ආචාර්ය ධම්මික පියතිස්ස බිබිලේ